3	ගරු නාගරික මන්ත්‍රී	පියසේන ප්‍රනාන්දු මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රීනී	අශෝකා රත්නමාලි මිය	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	කුමුදු ප්‍රනාන්දු මහතා	ඇත

6	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුදිගෝ මහතා	ඇත
7	ගරු නාගරික මන්ත්‍රිනී	පද්මා කොස්තා මිය	නැත
8	ගරු නාගරික මන්ත්‍රී	එච්. චන්දිම ඒ. පීරිස් මහතා	නැත
9	ගරු නාගරික මන්ත්‍රී	එම්.පද්මසිරි සිල්වා මහතා	නැත

<u>සහභාගී වූ නිලධාරීන්</u>

තනතුර	නම	පැමිණීම ඇත/නැත
වැඩ අධිකාරී	කේ.පී මායාරත්න මයා	නැත
මහජන සෞඛ්‍ය පරීක්ෂක	සම්පත් මොරමුදලි මයා	ඇත
තාක්ෂණ නිළධාරී	එස්.ඩී.ආර් තුෂාරා මිය.	ඇත
තාක්ෂණ නිළධාරී	එම්.ජී.සී.පී විජේරත්න මිය.	ඇත
සංවර්ධන නිලධාරී (නීති)	ඉමල්කා වේරගම මිය.	ඇත
සංවර්ධන නිලධාරී	ඒ.අයි අදිකාරම් මිය.	ඇත

<u>1.පෙත්සම</u> - පාණදුර බඩු ගබඩා පාරේ , වර්පනම් අංක 19 බී සහ 19/1 දරණ ස්ථානයේ මායිම ඉදිරියේ ගස් සිටුවීම සම්බන්ධ ගැටළුව.

පැමිණිලිකරු - සී.කේ.වී ලියනගේ මයා,

වග උත්තරකරු - කේ.ජේ.ජේ.සී ප්‍රනාන්දු මයා

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> -

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් දෙපාර්ශවය සභාවට කැඳවා සාකච්ඡා කර පහත උපදෙස් දෙනු ලැබීය.

- වග උත්තරකරු එම මාර්ග කොටස පිරිසිදුව හා අලංකාරව පවත්වා ගෙන ගියද මාර්ගය හා කාණුව සභාව සතු වන බැවින් හා ගැටළුවක් පැන නැගී ඇති බැවින් කාණුව හා මාර්ගය පිරිසිදු කිරීම නගර සභාව මගින් සිදු කරනු ලබන බවත්, ඒ සඳහා සභාවේ සිටින සේවකයින් අනුව කටයුතු කිරීමට හැකියාව ඇති බවත් අත්‍යවශ්‍ය කටයුතු වලට ප්‍රමුඛතාවය ලබා දෙන බැවින් යම් ප්‍රමාදයක් සිදු විය හැකි බවත් දැනුම් දුණි.
- පැමිණිලි පාර්ශවයට තම ඉඩමේ මායිම් (මාර්ගය දෙසට) වැට මායිමක් බැවින්පාරට නැමී ඇති ගස් අතු කපා නඩත්තු කළ යුතු බවත්,වැල් වර්ග පාරට වැටීම වලක්වා මායිම පිරිසිදුව පවත්වා ගත යුතු බවත්, දැනුම් දීමට තීරණය කරන ලදි.

2.<u>පෙත්සම</u> - වැකඩ, වලව්වත්ත, පුබුදු පෙදෙසේ පිහිටි අනතුරුදායක පොල් ගස සම්බන්ධ ගැටළුව.

පැමිණිලිකරු - උපුල් සරත්ද සිල්වා මයා.

වග උත්තරකරු - H.S.H.K සිල්වා මයා,

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> -

ස්ථාන පරීක්ෂණයක් සිදු කර අවසන් තීරණයක් ගැනීමට තීරණය කරන ලදි.

3. <u>පෙත්සම</u> - පාණදුර සිරිල් ජැන්ස් පාරේ අනවසර ඉදිකිරීම සම්බන්ධවයි. (මෙම ගැටළුව සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් ගරු ආණ්ඩුකාරතුමා අමතන ලද ලිපියේ පිටපතක් නගර සභාව වෙත එවා ඇත. එම ලිපියේ සඳහන් , "පළාත් පාලන අමාත්‍යාංශයෙන් දන්වා ඇති, ගැටළුව සමතයකට පත් වූ බව යන කරුණ ප්‍රතික්ෂේප කිරීම, හා නගර සභාවේ සභාපතිතුමා

හා පාණදුර ප්‍රාදේශීය ලේකම්තුමිය දේශපාලන හිතවත්කම් මත කටයුතු කර ඇති බව " යන්න පැහැදිලි කරවා ගැනීම සඳහා මෙම කැඳවීම සිදු කරන ලදි.)

පැමිණිලිකරු - පී.එන් තිසේරා මිය

වග උත්තරකරු - එල්.ඩබ් සෝමා කුමාරි මිය.

<u>කමිටුව වෙත දෙපාර්ශවය ඉදිරිපත් කළ අදහස්</u> -

- නගර සභා සභාපතිතුමා දේශපාලන හිතවත්කම් මත ලිපි ඉදිරිපත් කර , ලංකා විදුලි (පුද්.) සමාගමෙන් විදුලිය ලබා ගැනීමට හා වරිපනම් සාදා ගැනීමට කටයුතු කර ඇති බවට පැමිණිලිකරු විසින් ප්‍රකාශ කරන ලදි.
- ඉහත කරුණු සියල්ල වග උත්තරකාර පාර්ශවය විසින් ප්‍රතික්ෂේප කරන ලදි.
- වග උත්තරකාර සෝමා කුමාරි මහත්මිය විසින් ඉදිරිපත් කළ ලේඛන අතර, නගර සභා සභාපතිතුමා ඉහත කී ලේඛනයක් ලබා දී නොමැති බව පෙත්සම් කාරක සභාවට දක්නට ලැබුණි.

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> - ඉහත කරුණු පිළිබඳව දෙපාර්ශවයේ අදහස් විමසා බැලීම පමණක් පෙත්සම් කාරක සභාව විසින් සිදු කරන ලදි.

4. <u>පෙත්සම</u> - පාණදුර සොලමන් මාවතේ අංක 54 දරණ පිඹුරේ ජලය බැස්සවීම සඳහා වෙන් කර ඇති කාණුව නිසි පරිදි සකස් කර දෙන ලෙස කර ඇති ඉල්ලීම සම්බන්ධවයි.

පැමිණිලිකරු - ඩබ්.කේ පී ප්‍රනාන්දු මයා,

වග උත්තරකරු - පී.ආර්.ආර් ප්‍රනාන්දු මිය.

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> -

මෙම ගැටළුවට තුඩු දී ඇති කාණුව සහිත ඉඩම මැනුම් කිරීමට යොමු කර ඇති පී.අජිත් පී ද සිල්වා මිනින්දෝරු මහතාද සම්බන්ධ කර ගනිමින් දෙපාර්ශවයද ගෙන්වා නැවත සාකච්ඡා කිරීම සුදුසු බව පෙත්සම් කාරක සභාව තීරණය කරන ලදි.

05. <u>පෙත්සම</u> - පාණදුර, වැකඩ, පඤ්ඤානන්ද මාවතේ කාණු පද්ධතිය සම්බන්ධ ගැටළුව.

ඉල්ලුම්කරු - කේ. සමන් ශ්‍රීකාන්ත මයා

පාණදුර, වැකඩ, පඤ්ඤානන්ද මාවත අංක 25/4 නිවෙස් හිමියන් සහ 25/10 නිවෙස් හිමියන්ගේ ඉල්ලීම මත පාණදුර නගර සභාව විසින් අනුමත කොට සකසන ලද කාණු පද්ධතියට , අංක 25/14 නිවසේ වැසි ජලය හැරවීම ට එම හිමිකරුවන් ඉල්ලුම් කර ඇත. ඒ සඳහා අදාල කාණු පද්ධතිය ලබා දීම සම්බන්ධයෙන් ඉහත කී නිවෙස් හිමි ටී.පී.එන් සරච්චන්ද්‍ර (25/10) , ඩබ්.ටී.ආර්.ආර් චන්ද්‍රසේන (4/25) යන අය කැමැත්ත ලබා දී ඇති ලිපි ඉදිරිපත් කර ඇත.

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> - පූර්වයෙන් පැවති ගැටළුවක් නිරාකරණය කිරීම සඳහා ,ඉල්ලුම්කරුගේ ලිපියට එකගතාව ලබා දී ඇති පාර්ශව විසින් සභාවේ අවසරය මත ඉදිකළ වැසි ජල කාණුවට,ඉල්ලුම්කරුගේ කාණුව සම්බන්ධ කිරීමට සභාවේ විරෝධතාවක් නොමැති බැවින්, ඒ සඳහා එකගතාව ලබා දීමටත්, තාක්ෂණ නිලධාරීගේ උපදෙස් මත එම කාර්යය ඉටු කරන ලෙසත් උපදෙස් ලබා දීමට තීරණය කරන ලදි.

06. <u>පෙත්සම</u> - පානදුර, නිර්මල මාවතේ ප්‍රවේශ මාර්ගයේ ජලය බැස යාමේ නල පද්ධතියේ මතුවූ ගැටළුවක් නිරාකරණය කර ගැනීම සම්බන්ධවයි.

පැමිණිලිකරු - මුදිත ප්‍රනාන්දු මයා

වග උත්තරකරු - නෝමන් ජයසිංහ මයා

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> - අදාල මාර්ගය පෞද්ගලික මාර්ගයක් වන බැවින් ජල බස්නා ක්‍රමය සම්බන්ධයෙන් ගැටළුවක් මතුවන්නේ නම් පෞද්ගලිකව ජල බස්නාක්‍රමයක් සකසා ගන්නා ලෙස දෙපාර්ශවය දැනුවත් කිරීමට තීරණය කරන ලදි.

07. <u>පෙත්සම</u> - පාණදුර ගාළු පාර,අංක 559/5 ඇතුළු නිවාස සංකීර්ණය යාබද ජෙනරේටර් සම්බන්ධ ගැටළුව.

පැමිණිලිකරු - එල්.ඩී.පී ද සිල්වා මයා ඇතුළු පිරිස
වග උත්තරකරු - LOLC සමාගම

කමිටුව විසින් ගන්නා ලද තීරණය -

LOLC සමාගමේ ස්ථාපිත කර ඇති ජෙනරේටරයේ පවත්නා ශබ්දය සම්බන්ධව කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්තාව මේ වන විට සභාව වෙත ලැබී ඇත. එම වාර්තාවට අනුව, නගර සීමාව තුල පැවති හැකි උපරිම ශබ්ද සීමාව ඉක්මවා යාමක් සිදු වී නොමැති බව සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ප්‍රකාශ කරන ලදි. එබැවින්, නීතිමය ක්‍රියාමාර්ගයකට එළඹීමට හැකියාවක් නොපවතින බව පැමිණිලිකරුවන්ට දන්වා යැවීම සුදුසු බවට තීරණය කරන ලදි.

07. පෙත්සම - පාණදුර , වැකඩ, නිවසේ ආරක්ෂක තාප්පයට යා කර මඩුවක් සෑදීම හා වැසි ජලය තාප්පයට යොමු කිරීම සම්බන්ධ ගැටළුව.

පැමිණිලිකරු - එස්.පී ප්‍රනාන්දු මිය,
වග උත්තරකරු - උෂානි එදිරිසිංහ මිය,
කමිටුව විසින් ගන්නා ලද තීරණය -
ස්ථාන පරීක්ෂාවක් සිදු කර අවසන් තීරණයක් ලබා දීමට තීරණය කරන ලදි.

08.පෙත්සම - කුලතුංග පාරට අනවසරයෙන්, පාරට මුහුණලා ගේට්ටුවක් දැමීම.

පැමිණිලිකරු-එස්.එස් මනෝරත්න මිය.
වග උත්තරකරු - තමීර ලක්මාල් රුදිගෝ

කමිටුව විසින් ගන්නා ලද තීරණය -

මේ පැමිණිල්ල සලකා බැලූ කමිටුව පැමිණිලිකරුවන් ලබා දුන් වරිපනම් අංක හා නම් උපයෝගී කරගෙන සභාව විසින් මෙතෙක් කටයුතු කර ඇතත් මේ වන විට නියමිත ඉඩම් හිමිකරුගේ නම සහ ලිපිනය ලබා දී ඇති බැවින් ඉදිරි කටයුතු සඳහා එම නම සහ අංකය සහිත ලිපිනය භාවිත කිරීමට කමිටුව තීරණය කරන ලදි.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.09.12 මහජන පෙත්සම් කාරක සභා නිර්දේශ අනුමත කිරීමට තීරණය විය.

(ඊ.1.24.2) 2022.09.15 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී කේ.ඩී.අශෝකා රත්නමාලි මිය

ඒ අනුව 2022.09.15 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

පාණදුර නගර සභාව

සෞඛ්‍ය,පරිසර හා ආපදා කළමනාකරණ කමිටු වාර්තාව

දිනය : - 2022.09.15
වේලාව : - පෙ.ව. 10.00
ස්ථානය : - පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයින්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
2	ගරු උපසභාපති	පී.එච්.විල්මන් මහතා	ඇත

3	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	කේ.ඩී.අශෝකා රත්නමාලි මිය	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	එම්. කුමුදු ප්‍රනාන්දු මහතා	ඇත
7	ගරු නාගරික මන්ත්‍රී	පුෂ්පා ෆොන්සේකා මිය	නැත
8	ගරු නාගරික මන්ත්‍රී	එච්.වන්දිම ඒ.පීරිස් මහතා	ඇත
9	ගරු නාගරික මන්ත්‍රී	ගයා උදයංගනී ද සිල්වා මිය	ඇත

සහභාගී වූ වෙනත් නිළධාරීන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
2	මහජන සෞඛ්‍ය පරීක්ෂක	සම්පත් මොරමුදලි මහතා	ඇත
3	වැඩ අධිකාරී	කේ.පී.මායාරත්න මහතා	ඇත
4	අංශ ප්‍රධානී(සෞඛ්‍ය)	එච්.ටී.හෙට්ටිආරච්චි මිය	ඇත
5	සංවර්ධන නිළධාරී	අයි.වයි.කුරුප්පුආරච්චි මිය	ඇත
6	සෞඛ්‍ය පරිපාලක	දිල්හාර නන්දනතිලක මහතා	ඇත
7	සෞඛ්‍ය පරිපාලක	ආර්.ආර්.ඒ.වික්‍රමසිංහ මහතා	ඇත
8	සුසානභූමි භාරකරු	අජන්ත සෙත්සිරි මහතා	ඇත
9	උප පරිපාලක	බී.නිමල්සිරි පෙරේරා මහතා	ඇත
10	උප පරිපාලක	කේ.ජී.එම්.සුසිත වාමර මහතා	ඇත

01. අධික වර්ෂාව හේතුවෙන් සෞඛ්‍ය අංශයේ කසල කළමනාකරණ සේවක මහතුන්හට රාජකාරී ඉටු කිරීම සඳහා වැහිකබා ආවරණ ලබාගැනීම සඳහා සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

මීට පෙර සේවක මහතුන්හට වැහිකබා ලබාදී ඇති බැවින් ඔවුන් සතුව පවතින වැහිකබා පරීක්ෂා කර භාවිතයට ගත නොහැකි වැහි කබා ඇති සේවකයින් වෙත පමණක් දැනට පවතින වැහි කබා සභාව වෙත භාර ගනිමින් නව වැහිකබා ලබාදීම සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

02. පිහිණුම් තටාකයේ මෝටරය තිබෙන්නාවූ ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් වහලේ ජලය කාන්දු වන බැවින් එය අළුත්වැඩියා කර ගැනීම සඳහා සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

මෙම ගොඩනැගිල්ලේ ඉහළ මහලේ යම් ඉදිකිරීමක් කළ හැකිද යන්න වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත ඉල්ලීම් කර ඇති අතර එම වාර්තාව මේවන තෙක් සභාව වෙත ලැබී නොමැති බව වැඩ අධිකාරී කේ.පී.මායාරත්න මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව අදාළ වාර්තාව ලැබෙන තෙක් ඉදිකිරීමක් වෙත යොමු නොවී එම ඉහළ මහලේ ජලය රැඳීමකින් තොරව ගලා බසින ලෙස සිමෙන්ති යොදා සකස් කිරීම සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

03. පිහිණුම් තටාකයේ පැරණි මෝටරය අක්‍රිය වී ඇති බැවින් අළුත් මෝටරයක් ලබාගැනීම සඳහා සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

මෙම මෝටරය නිරීක්ෂණයේදී පෙර අළුත්වැඩියාවන් සිදුකරන විට අවිධිමත් ආකාරයෙන් වයර් අමුණමින් සිදුකර ඇති බවක් දිස්වන බව වැඩ අධිකාරී කේ.පී.මායාරත්න මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව නව මෝටරයක් මිලදී ගැනීමට පෙර පවතින මෝටරය නිසි ලෙස අළුත්වැඩියා කර භාවිතා කළ හැකිද යන්න පරීක්ෂා කිරීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

04. ආතර් වී දියෙස් උද්‍යානයේ ස්ථාන 03 ක තැබීම සඳහා දිරණ,නොදිරණ හා වීදුරු ලෙස වෙන් වෙන් වශයෙන් කසළ බඳුන් ලබා ගැනීම සඳහා සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

කසළ බඳුන් මිලදී ගැනීමකින් තොරව සභාව සතුව පවතින කසල බඳුන් මගින් ඒවා පිටස්තර පුද්ගලයින්ට රැගෙන යා නොහැකි ලෙසත් නැවත සභාව වෙත රැගෙන ආ හැකි ලෙසත් රාමුවක සකස් කර ස්ථාන දෙකක තැබීමත් ,හඩිසන් උද්‍යානයේ පවතින දැනට භාවිතයට නොගන්නා කසල බඳුනද ආතර් වී දියෙස් උද්‍යානයේ තවත් ස්ථානයක තැබීමත් සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

05. ආතර් වී දියෙස් උද්‍යානයේ ගස්වලින් වැටෙන්නාවූ කොළ අතු එක්රැස් කිරීම සඳහා ජීව කොටුවක් සෑදීම සඳහා සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

මුදල් වියදම් කිරීමකින් තොරව ස්වභාවික අමුද්‍රව්‍ය සපයා ගනිමින් ජීව කොටුවක් සෑදීම සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

06. මිනුවම්පිටිය සුසාන භූමියේ ප්‍රධාන ගේට්ටුව අබලන් වී ඇති බැවින් එය අළුත්වැඩියා කර ගැනීම සඳහා සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

පෑස්සුම් අංශයේ සේවකයින් මගින් මිනුවම්පිටිය සුසාන භූමි පරිශ්‍රයේ සිටම අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

07. නොයෙල් මෙන්ඩිස් මාවත දෙපස අවිධිමත් ලෙස කසල බැහැරලීම ගැටළුවක් වන අතර මාර්ගය විධිමත්ව හා පිරිසිදුව පවත්වාගෙන යාම සඳහා අදාළ ස්ථානය පිරිසිදු කොට එම ස්ථානයේ රුක් රෝපණ වැඩසටහනක් (පැල 12 ක් සිටුවීමට) ක්‍රියාත්මක කිරීමට සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

නොයෙල් මෙන්ඩිස් මාවත දෙපස රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

08. <u>සාකච්ඡා කරන ලද වෙනත් කරුණු</u>

8.1 නොයෙල් මෙන්ඩිස් මාවත දෙපස කසල බැහැර කරමින් අවිධිමත්ව පවතින අතර එම මාර්ගයේ දමා ඇති ගලවා ඉවත් කරන ලද විදුලි කණු හා දුරකථන කණු එම ස්ථානයෙන් ඉවත් කර ගෙන එම මාර්ග කොටස පිරිසිදු කර ලබාදෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.2 ආතර් වී දියෙස් උද්‍යානය,සභාව වෙත පවරා දෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉල්ලීම් කළද ඒ සඳහා කිසිදු පියවරක් මේ වන තෙක් අදාළ ආයතනය විසින් ගෙන නැත.එමනිසා මෙය සභාව සතු ඉඩමක් නොවන බැවින් සේවකයින් යොදමින් සභාව විසින් අදාළ ස්ථානය නඩත්තු කිරීමත් ඒ සඳහා සභා අරමුදල් යෙදවීම පිළිබඳවත් පක්ෂයක් ලෙස ජනතා විමුක්ති පෙරමුණ විරුද්ධත්වය දක්වන බව ගරු නාගරික මන්ත්‍රී එච්.වන්දිම ඒ.පීරිස් මහතා කමිටුව වෙත පවසා සිටි අතර එම විරුද්ධත්වය ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතාද ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතාද දක්වා සිටින ලදී.මෙහි රැඳී සිටින යාචකයින් විසින් මෙය අපිරිසිදු කරන අතර නගර මධ්‍යයේ ඇති ස්ථානයක් බැවින් මෙහි පිරිසිදුතාවය පිළිබඳව සලකා බැලිය යුතු බව ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.කෙසේ හෝ මෙම ඉඩම සභාව සතු දේපළක් නොවන බව ජනතාව වෙත දැනුවත් කිරීමට ඒ බව සඳහන් කරමින් පුවරුවක් සවිකිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව මෙය සභාව සතු දේපළක් නොවන බවට පුවරුවක් සවිකිරීමත් ,දැනට එම ස්ථානය සඳහා සේවක මහතෙකු යොදවා ඇති බැවින් එහි රැඳී සිටින යාචකයින් ඉවත් කිරීමට සෑම උදෑසනකම කටයුතු කරන ලෙස ඔහුව දැනුවත් කිරීමත් යාචකයින්ගේ රැඳී සිටීම පිළිබඳව පරිසර පොලීසිය දැනුවත් කිරීමට කටයුතු කිරීමත් සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.3 කසල අංගනයේ පිටුපස ගේට්ටුව අසලට අනවසරයෙන් කසල ගෙනැවිත් දමන අතර මෙසේ නගරයේ ස්ථාන කිහිපයකම අනවසරයෙන් කසල බැහැර කිරීමක් දක්නට ලැබෙන බව ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව නැවතත් එසේ අනවසරයෙන් කසල බැහැර කරන්නන් ඇල්ලීම සඳහා හදිසි වැටලීම් සිදුකිරීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.4 කසල අංගනයේ හදිසි නිරීක්ෂණයක් සඳහා යොමුවූ අතර එහිදී ගියවර සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කළ පරිදි කසල අංගනයේ ඇති ගොඩනැගිල්ලේ ඉහළ මහල වසා දමා යතුර සභාව වෙත භාරදී නොමැති බවත් කසල අංගනය තුල කසල රැගෙන යන ආයතනයේ ටිපර් රථ දෙකක් නවතා තබා තිබූ අතරම කසල රථ පරීක්ෂාවේදී එම කසල කිසිදු තේරීමකින් තොරව කසල අංගනය වෙත කසල රැගෙන එන බවත් කසල අංගනය වෙත රැගෙන ආ කසල වලින් යම් යම් ද්‍රව්‍ය ,නැවත සේවක මහතුන් විසින් පිටත රැගෙන යාමක් දිස්වූ බවත් ලේකම්තුමිය විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.

සෞඛ්‍ය කමිටුව විසින් යම් නිර්දේශයක් ලබාදුන් විට එම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට සියළුම නිළධාරීන් හා සේවක මහතුන් බැඳී සිටින අතර වහාම කසල අංගනයේ ඇති ගොඩනැගිල්ලේ ඉහල මහලේ යතුර සභාව වෙත භාර දීමට කටයුතු කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

තවද කසල අංගනය තුල කිසිදු වෙනත් ආයතනයක ටිපර් රථ නවතා තැබිය නොහැකි අතර මීට පෙර එසේ නවතා තැබීමෙන් සභාවේ වාහන අනතුරුවලටද භාජනය වී ඇත.කසල තේරීම සම්බන්ධයෙන් ගත් විට කසල රැස්කරන්නාවූ රථහී රියදුරා සමඟ තවත් සේවකයින් ගමන් කරන බැවින් ඔවුන් කසල ගැනීමේදී ඒවා මිශ්‍ර කසල වශයෙන් භාර නොගත යුතුයි.එමෙන්ම කසල අංගනය වෙත කසල රැගෙන ආ පසු කිසිදු අවසරයකින් තොරව එහි ද්‍රව්‍ය පිටතට රැගෙන නොයා යුතුයි.මේ සියළු කරුණු සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් විසින් දෛනිකව සෘජු අධීක්ෂණයක් කිරීමට කටයුතු කළ යුතු බවත් පොලිතීන්,ප්ලාස්ටික් බෝතල් හා පොල්කටු වැනි දේ විකිණීමෙන් මේදක්වා ලබාගත් ආදායම් පිළිබඳ වාර්තාවක් මීළඟ කමිටුවට ලබාදීමට කටයුතු කරන ලෙසත් සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.5 පිහිණුම් තටාකයේ සේවක මහතුන් රැඳී සිටින ගොඩනැගිල්ල ඉතාමත් අවිධිමත් ආකාරයෙන් පවත්වාගෙන යන බවත් පෙර ආපනශාලාව ලෙස භාවිතා කළ ගොඩනැගිල්ලේ ඉඩපහසුකම් පවතින බැවින් එහි කොටසක් පමණක් ආපනශාලාව සඳහා වෙන්කර අනෙක් ඉඩ ප්‍රමාණය කාය වර්ධන මධ්‍යස්ථානයක් ලෙස සකස් කර ජනතාවගේ භාවිතය සඳහා ලබාදීම සුදුසු බව වැඩ අධිකාරී කේ.පී.මායාරත්න මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.

ඒ අනුව පිහිණුම් තටාකයේ සේවක මහතුන්වෙත අදාළ ස්ථාන පිරිසිදුව හා ක්‍රමානුකූලව පවත්වාගෙන යාම පිළිබඳව උපදෙස් ලබාදීමත් පෙර ආපනශාලාව ලෙස භාවිතා කළ ගොඩනැගිල්ලේ ,ආපනශාලාවට හා කාය වර්ධන මධ්‍යස්ථානයක් ලෙස කෙසේ වෙන්කළ හැකිද යන්න තාක්ෂණ නිළධාරී නිර්දේශ ඉදිරි කමිටුවක් වෙත ලබාදීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.09.15 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු නිර්දේශ අනුමත කිරීමට තීරණය විය.

(ඊ.1.24.3) 2022.09.15 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

ඒ අනුව 2022.09.15 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

<u>පාණදුර නගර සභාව</u>

<u>කර්මාන්ත හා නගර සභා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව</u>

දිනය : - 2022.09.15

වේලාව : - ප.ව. 12.30

ස්ථානය : - පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයින්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
2	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
3	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	එම්. පියසේන ප්‍රනාන්දු මහතා	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුදිගෝ මහතා	ඇත
7	ගරු නාගරික මන්ත්‍රී	මහින්ද පුන්සිරි මහතා	නැත
8	ගරු නාගරික මන්ත්‍රී	ආර්. බන්දුල සොයිසා මහතා	ඇත
9	ගරු නාගරික මන්ත්‍රී	ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය	ඇත

සහභාගී වූ වෙනත් නිළධාරීන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
2	වැඩ අධිකාරී	කේ.පී.මායාරත්න මහතා	ඇත
3	තාක්ෂණ නිළධාරී	එස්.ඩී.ආර්. තුෂාරා මිය	ඇත
4	තාක්ෂණ නිළධාරී	ප්‍රසාදි විජේරත්න මිය	ඇත
5	තාක්ෂණ නිළධාරී	ජයන්ත ඇල්පිටිය මහතා	ඇත
6	අංශ ප්‍රධානී (කර්මාන්ත)	තමිලා විජයසිංහ මිය	ඇත
7	සංවර්ධන නිළධාරී(නීති)	ඉමල්කා වේරගම මිය	ඇත
8	කර්මාන්ත පරිපාලක	නිමල් අල්විස් මහතා	ඇත
9	වැඩ අධීක්ෂක	ජේ.අමිත් ඩිල්ෂාන් මහතා	ඇත
10	වැඩ අධීක්ෂක	වරින් ප්‍රසාද් වික්‍රමසූරිය මහතා	ඇත
11	වැඩ අධීක්ෂක	චමිල ලසන්ත මහතා	ඇත

01. PUC/05/03/01-07/2020 ලිපි ගොනුවට අනුව 226-1085 අංක දරණ ගලි රථය ,Panadura Auto Service ආයතනය මගින් සේවා කිරීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 39,435/= ක මුදල ගෙවීමට කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 39,435/= ක මුදල, Panadura Auto Service ආයතනය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

02. PUC/05/03/01-23/2020 ලිපි ගොනුවට අනුව ZB-0323 අංක දරණ කම්පැක්ටර් රථය,Panadura Auto Service ආයතනය මගින් සේවා කිරීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 32,115/= ක මුදල ගෙවීමට කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 32,115/= ක මුදල, Panadura Auto Service ආයතනය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

03. PUC/5/4/1/5/2021 ලිපිගොනුවට අනුව මිනුවම්පිටිය ආදාහනාගාරයේ කඩිනමින් සිදුකල යුතු අළුත්වැඩියා වෙනුවෙන් එල්.ඒ.එල්.ලියනාරච්චි ආයතනය විසින් යොමු කර ඇති රු 395,000.00 ක මිල ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

සිදුකළ යුතු අළුත්වැඩියාවන් සම්බන්ධයෙන් නිරීක්ෂණය කළ යුතු බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් පවසා සිටි අතර ඒ අනුව අදාළ නිරීක්ෂණ කටයුතු සිදු කිරීමෙන් පසු නැවත ඉදිරිපත් කිරීමට කල්තබන ලදී.

04. <u>සාකච්ඡා කරන ලද වෙනත් කරුණු</u>

4.1 PUC/5/4/1/21/2022 කසල අංගනය යාබද රථ ගාලෙහි වැසිකිළිය අළුත්වැඩියා කිරීමේ ගොනුවට අනුව සකස් කර ඇති රු 149,192.09 ක් වූ ඇස්තමේන්තුව, කර්මාන්ත කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු 149,192.09 ක් වූ ඇස්තමේන්තුව,කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

4.2 PUC/5/4/1/20/2022 ලිපි ගොනුවට අනුව සභාවේ වාර්ෂික මාර්ග නඩත්තු සැලැස්ම කර්මාන්ත කමිටුවේ සාකච්ඡා කර තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

ඉදිරිපත් කරන ලද වාර්ෂික මාර්ග නඩත්තු සැලැස්ම,ඉදිරිපත් කර ඇත්තේ උතුරු කලාපයේ හා මැද කලාපයේ මාර්ග සඳහා පමණක් වන අතර එම කලාපයන්හී පහත සඳහන් මාර්ග හී ඇති ඉටු කළ යුතු නඩත්තු කටයුතු ඉටු කිරීමටත් එම මාර්ග අතරින් මේවන විට ශ්‍රී මහා විහාර පාර නඩත්තු කිරීමට කටයුතු කර ඇති බැවින් ප්‍රථමයෙන් සොලමන් මාවතේ කාපට් නොකරන ලද ඉතිරි කොටස සකස් කිරීමත් ඉන්පසු ජනප්‍රිය මාවතේ මුල් කොටස සංවර්ධනය කිරීමෙන් පසු අනෙක් මාර්ගහී නඩත්තු කටයුතු වෙත යොමු වීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

<u>උතුරු කලාපයට අයත් මාර්ග</u>

- ශ්‍රී විජය පාර
- ධම්මානන්ද පාර
- පොදු සේවා මාවත
- ලෙනින් ප්‍රනාන්දු මාවත(පළමු අතුරු පාර)
- මිනුවන්පිටිය පාර
- තිලක මාවත
- ස්වර්ණජෝති පාර
- ඉන්ද්‍රජෝති පාර
- සෝමානන්ද පාර
- අශෝක මාවත

<u>මැද කලාපයට අයත් මාර්ග</u>

- ශ්‍රී මහා විහාර පාර
- සාගර මාවත
- ජනප්‍රිය මාවත
- ඩඩ්ලි සේනානායක මාවත
- සොලමන් මාවත ඉතිරි කොටස
- සොලමන් පාර
- මෙත්සිරි සිල්වා පෙදෙස
- ෆොන්සේකා පාර

4.3 කසල අංගනය අසළ ඇති නව රථගාලේ වැසිකිළියක් පවතින අතර එය අළුත්වැඩියා කර භාවිතා කළ හැකි බැවින් වෙරළෙහි පැවති වැසිකිළි පහසුකම් සහිත කන්ටේනරය අළුත්වැඩියා කර ආතර් වී දියෙස් උද්‍යානයේ සුදුසු ස්ථානයක ස්ථානගත කර ජනතාව වෙත වැසිකිළි පහසුකම් සඳහා ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පවසා සිටි අතර එය කමිටුවේ සියළු සාමාජිකයින්ගේ එකඟත්වය මත නිර්දේශ කරන ලදී.

4.4 ආතර් වී දියෙස් උද්‍යානයේ කුට්ටිගල් අතරින් තණකොළ වැවී තිබෙන අතර ඒවා ගලවා ඉවත් නොකළහොත් එම තණකොළ ගස් වර්ධනය වන විට කුට්ටිගල් ගැලවීමට ඉඩ ඇති බවත් එම උද්‍යානයේ විදුලි බුබුළු සඳහා සවිකර තිබූ වයර් මේවන විට බිම් මට්ටමේ බුබුළු රහිතව විවෘතව ඇති අතර එයින් යම් මොහොතක අනතුරක් සිදුවිය හැකි බවත් ගරු නාගරික මන්ත්‍රී ලලීන් හසන්ත රුදිගෝ මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව මෙම භූමියේ තණකොළ,එම භූමියේ කටයුතු සඳහා යොදවා ඇති සේවක මහතා ලවා ගලවා ඉවත් කිරීමට කටයුතු කරන ලෙසත්

විවෘතව ඇති විදුලි වයර් ,විදුලි අංශයේ සේවකයින් යොදවමින් ආවරණය කිරීමට කටයුතු කරන ලෙසත් කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.5 මාර්ග නඩත්තු කටයුතු ඉටු කිරීමේදී සභාව වෙත මුදල් ගෙවීමකින් තොරව ජලසැපයුම් ලබාදීම සඳහා ,ජලසම්පාදන මණ්ඩලය විසින් කර ඇති මාර්ග හානී අළුත්වැඩියා කිරීමට කටයුතු නොකළ යුතු බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් පවසා සිටින ලදී.ඒ අනුව මාර්ග නඩත්තු කිරීමේදී සභාව වෙත මුදල් ගෙවා නොමැති මාර්ග හානී පිළිබඳව ජාතික ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කිරීමටත් සභාව වෙත මුදල් ගෙවා ඇති මාර්ග හානී අළුත්වැඩියා කිරීමට කටයුතු කරන ලෙසත් කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.6 වැකඩ කියවීම් ශාලාවේ ඉහළ මහලේ මේවන විට විදුලි පංකා සවිකර ඇති අතර රටේ පවතින ආර්ථිකමය අර්බුදකාරී තත්ත්වය මත සොරසතුරන්ගේ වැඩි වීමක් දක්නට ලැබෙන බැවින් යම් හෙයකින් මෙම විදුලි පංකාද ගලවා ගෙන යාමට ඉඩ ඇත.එබැවින් එම ගොඩනැගිල්ලේ ජනෙල් සඳහා ග්‍රිල් ගැසීම සිදුකළ යුතු බව ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව වැකඩ කියවීම් ශාලාවේ ඉහළ මහලේ ජනෙල් සඳහා ග්‍රිල් ගැසීම, කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.7 හොරණ පාරේ ඩිපෝ එක ඉදිරිපිට ඇති පාර මාරුවීමේ කහඉර අවසන් වන ස්ථානයේ කාණුව මත දමා ඇති කොන්ක්‍රීට් ස්ලැබ් කෑල්ල කැඩී ඇති අතර එම ස්ථානයෙන් පාසල් ළමුන් ඇතුළු විශාල පිරිසක් පාර මාරු වන බැවින් යම් අනතුරක් සිදුවිය හැකි බව ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.කුරුණෑගල සිදුවූ අවාසනාවන්ත සිදුවීමද පූර්වාදර්ශයක් ලෙස සිතමින් මෙසේ කොන්ක්‍රීට් ස්ලැබ් දැමිය යුතු කාණු හඳුනාගනිමින් ඒවා වෙත ස්ලැබ් දමා කඩිනමින් අවසන් කළ යුතු බව ගරු සභාපතිතුමාද කමිටුව වෙත පවසා සිටින ලදී.ඒ අනුව කර්මාන්ත අංශයේ සේවකයින් විසින් සකස් කරනු ලබන කොන්ක්‍රීට් ස්ලැබ් වලට අමතරව ඒවා සකස් කරනු ලබන ආයතනයකින් මිලදී ගෙනද ආවරණය කළ යුතු කාණු ආවරණය කිරීමට කටයුතු කරන ලෙස කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.8 මාර්ගයන්හි අළුත්වැඩියා කටයුතු කිරීමේදී ඒ පිළිබඳව එම මාර්ග තුළට ඇතුළත් වෙන ජනතාව දැනුවත් කිරීමට කටයුතු කළ යුතු බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.මේවන විට මාර්ග අළුත්වැඩියා කටයුතු කිරීමේදී භාවිතා කළ යුතු කෝන් ආදිය මිලදී ගෙන ඇති බැවින් ඒවා යොදා ගැනීමටත් මාර්ග අළුත්වැඩියාවන් සිදුකරන බවට ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය පුවරු සකස් කර ගනිමින් ඒ ඔස්සේ ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.09.15 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ අනුමත කිරීමට තීරණය විය.

(ඊ.1.24.4) 2022.09.26 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය

ඒ අනුව 2022.09.26 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව පහත පරිදි වේ.

<u>පාණදුර නගර සභාව</u>

<u>මුදල් කමිටු රැස්වීම් වාර්තාව</u>

දිනය :2022.09.26

වේලාව : පෙ.ව.10.00

ස්ථානය :පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
01	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
02	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
03	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
04	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	ඇත
05	ගරු නාගරික මන්ත්‍රී	කේ.ඩී.අශෝකා රත්නමාලි මිය	ඇත
06	ගරු නාගරික මන්ත්‍රී	කුමුදු ප්‍රනාන්දු මහතා	ඇත
07	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුදිගෝ මහතා	ඇත
08	ගරු නාගරික මන්ත්‍රී	පද්මා කොස්තා මිය	නැත
09	ගරු නාගරික මන්ත්‍රී	ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය	ඇත

සහභාගී වූ වෙනත් නිලධාරී

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
01	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
02	ගණකාධිකාරී	තිලක් මුණසිංහ මහතා	ඇත
03	පරිපාලන නිළධාරී (වැ.බ)	කුමුදු අබේසේකර මිය	ඇත
04	වැඩ අධිකාරී	කේ.පී.මායාරත්න මහතා	ඇත
05	අභ්‍යන්තර විගණන නිළධාරී	කේ.සී. ද සිල්වා මිය	ඇත
06	අංශ ප්‍රධානී (ආයතන)	කේ.ඩී.යූ.පී.ජයරත්න මිය	ඇත
07	අංශ ප්‍රධානී (වරිපනම්)	ඩී.ඩී.ඒ.එල්.ශ්‍රියාණි මිය	ඇත
08	අංශ ප්‍රධානී (කර්මාන්ත)	තමිලා විජයසිංහ මිය	ඇත
09	අංශ ප්‍රධානී (සෞඛ්‍ය)	එච්.ටී. හෙට්ටිආරච්චි මිය	ඇත
10	අංශ ප්‍රධානී (මිශ්‍ර ආදායම්)	ඡමිලා ධර්මරත්න මිය	ඇත
11	අංශ ප්‍රධානී (ගිණුම්)	ඒ.ඒ. චන්ද්‍රිකා මිය	ඇත
12	සංවර්ධන නිලධාරී (ප්‍රජා සංවර්ධන)	ඉරෝමි යසෝධා කුරුප්පු ආරච්චි මිය	ඇත
13	ආදායම් පරීක්ෂක	පී.එම්.පියල් පද්මචන්ද්‍ර මහතා	ඇත
14	ආදායම් පරීක්ෂක	ටී.සුනිල් ජයලාල් මහතා	ඇත
15	ආදායම් පරිපාලක (වැ.බ.)	ඩබ්.ඉරාන් ධර්මප්‍රිය මහතා	ඇත
16	ආදායම් පරිපාලක (වැ.බ.)	තරංග ජනකමිණි මහතා	ඇත
17	ආදායම් පරිපාලක (වැ.බ.)	සුරේෂ් මධුරංග මහතා	ඇත

01. වරිපනම් අංශය

1.1 ලිපි ගොනු අංකය PUC/03/05/02/22/2022

කොට්ඨාශ අංකය හා වීදිය	04, නිර්මල මාවත
අයිතිකරු	වෛද්‍ය එම්.ඩී.එන්.වික්‍රමසිංහ
වරිපනම් අංක	5A
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	රු 5400/=
වාර්ෂික වටිනාකම	රු.54,000/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.08.10
ඉල්ලීම	ව්‍යාපාරික ස්ථානය වසා දමා ඇති බැවින් නේවාසික ප්‍රතිශතයට බදු අයකරන ලෙස

ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	වෛද්‍ය මධ්‍යස්ථානය වසා දමා ඇති බැවින් 2022/3 වන කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අයකිරීම

හිඟ වරිපනම් බදු මුදල් අයකිරීමට යටත්ව වෛද්‍ය මධ්‍යස්ථානය වසා දමා ඇති බැවින් 2022/3 වන කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

1.2 ලිපි ගොනු අංකය PUC/03/02/04/12/22

කොට්ඨාශ අංකය හා වීදිය	01, මහ වීදිය
අයිතිකරු	එච්.රොෂාන් පෙරේරා
වරිපනම් අංක	6/5A
දේපල විස්තරය	නේවාසික
හිග බදු මුදල	නැත
වාර්ෂික වටිනාකම	රු.33,962/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.06.17
ඉල්ලීම	අදාල නිවසෙහි ව්‍යාපාරික ස්ථානයක් පවත්වා ගෙන යන බැවින් 20% වාණිජ ප්‍රතිශතයට බදු අයකරන ලෙස
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	ව්‍යාපාරික ස්ථානයක් ලෙස (සුපර් විෂන් ටෙක්නොලජි පුද්ගලික සමාගම) පවත්වා ගෙන යන බැවින් 2022/3 වන කාර්තුවේ සිට 20% වාණිජ ප්‍රතිශතය මත බදු අයකිරීම

ව්‍යාපාරික ස්ථානයක් ලෙස පවත්වා ගෙන යන බැවින් 2022/3 වන කාර්තුවේ සිට 20% වාණිජ ප්‍රතිශතය මත බදු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

1.3 ලිපි ගොනු අංකය PUC/03/07/12/2022

කොට්ඨාශ අංකය හා වීදිය	09, ඉන්ද්‍රජෝති මාවත
අයිතිකරු	කේ.ඒ.ඩී.ගිහාන් සංජීව කුරුප්පු
වරිපනම් අංක	2 A
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	නැත
වාර්ෂික වටිනාකම	රු.50,250/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.09.02
ඉල්ලීම	ව්‍යාපාරික ස්ථානය ඉවත් කර ඇති බැවින් වරිපනම් ලේඛණයෙන් එකී දේපළ ඉවත් කරන ලෙස
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	ව්‍යාපාරික ස්ථානය කඩා ඉවත් කර ඇති බැවින් 2022/3 වන කාර්තුවේ සිට එකී දේපල වරිපනම් ලේඛණයෙන් ඉවත් කිරීම සඳහා

ව්‍යාපාරික ස්ථානය කඩා ඉවත් කර ඇති බැවින් 2022/3 වන කාර්තුවේ සිට එකී දේපල වරිපනම් ලේඛණයෙන් ඉවත් කිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

1.4 ලිපි ගොනු අංකය PUC/03/07/13/2022

කොට්ඨාශ අංකය හා වීදිය	09, තන්තිරිමුල්ල පාර
අයිතිකරු	එම්.ඩී.ගිල්බට් අප්පුහාමි
වරිපනම් අංක	80
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	1500/=
වාර්ෂික වටිනාකම	රු.30,000/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.09.02
ඉල්ලීම	අදාළ ස්ථානයේ ව්‍යාපාරයක් නොකරන අතර ඉදිරියේදී ද ව්‍යාපාරයක් කිරීමට අදහස් නොකරන බැවින් වරිපනම් බදු සංශෝධනය කිරීමට

ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	ව්‍යාපාරික ස්ථානය හිස්ව පවතින බැවින් 2022/3 වන කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අය කිරීම

හිඟ වරිපනම් බදු මුදල් අයකිරීමට යටත්ව ව්‍යාපාරික ස්ථානය හිස්ව පවතින බැවින් 2022/3 වන කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අය කිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

1.5 ලිපි ගොනු අංකය PUC/03/05/02/42/2020

කොට්ඨාශ අංකය හා වීදිය	04, ගාලු පාර
අයිතිකරු	ජේ.කේ.වයි.හර්ෂණ ජයනෙත්ති
වරිපනම් අංක	570
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	නැත
වාර්ෂික වටිනාකම	රු.135,000/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.09.09
ඉල්ලීම	අදාළ ස්ථානයේ ව්‍යාපාරයක් නොකරන බැවින් නේවාසික ප්‍රතිශතයට බදු අයකිරීම
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	අදාළ ගොඩනැගිල්ල ව්‍යාපාරික ස්ථානයක් ලෙස නොව නිවසක් ලෙස භාවිතා කරන බැවින් 2022/03 වන කාර්තුවේ සිට දේපළ විස්තරය "ඇස්බැස්ටස් සෙවිලි නිවස" ලෙස සංශෝධනය කිරීම

අදාළ ගොඩනැගිල්ල ව්‍යාපාරික ස්ථානයක් ලෙස නොව නිවසක් ලෙස භාවිතා කරන බැවින් 2022/03 වන කාර්තුවේ සිට දේපළ විස්තරය "ඇස්බැස්ටස් සෙවිලි නිවස" ලෙස සංශෝධනය කිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

1.6 ලිපි ගොනු අංකය PUC/03/07/11/2022

කොට්ඨාශ අංකය හා වීදිය	09, පෙරේරා මාවත
අයිතිකරු	බී.තුෂාල් ප්‍රියදේව ප්‍රනාන්දු
වරිපනම් අංක	02E
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	රු 18,000/=
වාර්ෂික වටිනාකම	රු.45,000/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.08.26
ඉල්ලීම	පසුගිය වසර දෙකක කාලයක් ව්‍යාපාරික ස්ථානය වසා තිබූ බැවින් හිඟ වරිපනම් බදු සඳහා සහනයක් ලබාදෙන ලෙස
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	දැනට ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යන බැවින් බදු ප්‍රතිශතය සංශෝධනය කල නොහැක.හිඟ බදු ගෙවීම සඳහා සහනයක් ලබාදීම සලකා බැලීම

හිඟ බදු මුදල වාරික 04 කින් ගෙවීමට අවස්ථාව දීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

1.7 ලිපි ගොනු අංකය PUC/03/06/02/58/2021

කොට්ඨාශ අංකය හා වීදිය	05, මහ වීදිය
අයිතිකරු	ජූඩ් ප්‍රනාන්දු පුල්ලේ ඇසෝසියේට්ස් (පුද්.) සමාගම
වරිපනම් අංක	638 B 1/1
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	නැත
වාර්ෂික වටිනාකම	රු.90,000/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.09.05
ඉල්ලීම	උඩුමහලේ ව්‍යාපාරික කටයුතු සිදු නොකරන බැවින් බදු සහනයක් ලබාදෙන ලෙස
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	2022/04 සිට අදාළ ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු නොකරන බැවින් 5% නේවාසික ප්‍රතිශතයට බදු අයකිරීම

ව්‍යාපාරික කටයුතු සිදු නොකරන බැවින් 2022/04 වන කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

1.8 ලිපි ගොනු අංකය PUC/03/06/02/140/2022

කොට්ඨාශ අංකය හා වීදිය	02, මහ වීදිය
අයිතිකරු	සී.පී.මෙනල් නෝර්මන් පෙරේරා
වරිපනම් අංක	322 B
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	රු 23,940.00
වාර්ෂික වටිනාකම	රු.30,000/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.08.10
ඉල්ලීම	ව්‍යාපාරික ස්ථානය කොවිඩ් සමයේ සිට වසා ඇති බැවින් වරිපනම් බදු මුදල සඳහා සහනයක් ලබා ගැනීම
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	ව්‍යාපාරික ස්ථානය වසා දමා ඇති බැවින් 2022/03 වන කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතය මත බදු අයකිරීම

හිඟ වරිපනම් බදු මුදල් අයකිරීමට යටත්ව ව්‍යාපාරික ස්ථානය වසා දමා ඇති බැවින් 2022/3 වන කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අය කිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

1.9 ලිපි ගොනු අංකය PUC/03/06/02/139/2022

කොට්ඨාශ අංකය හා වීදිය	02, මහ වීදිය	
අයිතිකරු	ඒ.ජී.ජයරත්න ගුණසිංහ	
වරිපනම් අංක	223A/02/1	223A/03/1
දේපල විස්තරය	වාණිජ්‍ය	වාණිජ්‍ය
හිග බදු මුදල	නැත	නැත
වාර්ෂික වටිනාකම	රු.90,000/-	රු 75,000/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.08.25	
ඉල්ලීම	ව්‍යාපාරික ස්ථාන වෙනත් ස්ථානයකට රැගෙන ගොස් ඇති බව	
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	ව්‍යාපාරික ස්ථාන වසා දමා ඇති බැවින් 2022/03 වන කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අයකිරීම	

ව්‍යාපාරික ස්ථාන වසා දමා ඇති බැවින් 2022/03 වන කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

02. <u>මිශ්‍රආදායම් අංශය</u>

2.1 ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශයේ, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මඟින් 2020 දෙසැම්බර් මාසයේදී අලෙවි ප්‍රදර්ශණයක් පැවැත්වීම සඳහා රු 75,650.00 ක මුදලක් ගෙවා ඇත.නමුත් රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය නිසා එම ප්‍රදර්ශණය පැවැත්වීමට නොහැකි විය.2022.05.13 දින ලිපියක් මඟින් එම මුදල ආපසු ඉල්ලා ඇති අතර සභා ආදායමින් ආපසු ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 75,650.00 ක මුදලින් 5% මුදලක් රඳවා ගනිමින් සහා ආදායමින් ආපසු ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.2 සුපර් ෆැෂන් ආයතනයේ වාහන රථගාල ලෙස ටෙනිස් පිටිය මාසිකව වෙන්කර ගනු ලබයි.ඒ සඳහා දිනකට රු 3000.00 බැගින් අයකරනු ලබන අතර වර්තමානයේ දේපළ මිල ගණන් ඉහළ යාම මත සහ ආදායම් පරීක්ෂක නිර්දේශය අනුව 2023 වර්ෂයේ සිට එම මුදල රු 4000.00 ක් ලෙස වැඩිකිරීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

2023 වර්ෂයේ සිට දිනකට රු 5000.00 ක් අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.3 නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේදී කඩා ඉවත් කිරීමට ලක්නොවූ හඳුනාගත් කඩ 42 ක් සඳහා මාසික කුලී මුදල් අයකිරීමට ආදායම් පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කර ඇති පහත තාවකාලික තක්සේරුව මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

අනු අංකය	කඩ අංකය	ස්වභාවය	නම	ලිපිනය	තක්සේරු මුදල(රු)
1	EG 71	කරවල	කේ.ඒ.සුමිත් චන්ද්‍ර කුමාර ප්‍රනාන්දු	345/2,මිරිස්වත්ත,මහවිල,පාණදුර	3000.00
2	EG 72	කොළ	ඇනිගේ එවුලින් සිල්වා	388/7,පාසල් පාර,තන්තිරිමුල්ල,පාණදුර	3000.00
3	EG 73	පොල්	සුසන්ත ප්‍රේශ්ලි ජයතිලක කළුආරච්චි	384/6, පාසල් පාර,තන්තිරිමුල්ල,පාණදුර	3000.00
4	EG 74	වලං	මෙබල් විජේරාම	25/1 A, වීරමන් පාර, පාණදුර	3000.00
5	EG 75	වලං	ඩී.කේ.තමරා පියසිලි	68/2, වලාන ,පාණදුර	3000.00
6	EG 76	එළවලු	එල්.රූකාන්ත ප්‍රමිත් අබේකෝන්	27/2, ගැමුණු මාවත, කෙසෙල්වත්ත, පාණදුර	3000.00
7	EG 78	වලං	කේ.ජී.නිමල්සිරි	27/15, ධර්මශාලාව පාර, ඩයස් වත්ත, පාණදුර	3000.00
8	EG 79	වලං	පී.රංජනී ශ්‍රීයාලතා	19/2 A, සුසන්ත මාවත, පාණදුර	3000.00
9	EG 80	වලං	බී.ඩබ්.ජගත් ක්‍රිශාන්ත මෙන්ඩිස්	28/16,වීරපුරන්නප්පු මාවත,ලක්ෂපතිය,මොරටුව	3000.00
10	EG 81	වලං	රුවන්පුර ඉන්ද්‍රානි	27/14 ධර්මශාලාව පාර,ඩයස් වත්ත,පාණදුර	3000.00
11	EG 82	වලං	එච්.කුමාරසිරි පෙරේරා	26/B/1 ජනජය මාවත,ඇටඹගොඩ,පාණදුර	3000.00
12	Tem01	අල ලූණු	බී.එච්.අජිත් ක්‍රිශාන්ත	43/5 සාගර මාවත,පාණදුර	3000.00
13	Tem02	අල ලූණු	ඩබ්.ක්‍රිශෝක් සංජීව ප්‍රනාන්දු	32/1,සාගර මාවත,පාණදුර	3000.00
14	Tem03	අල ලූණු	එච්.එල්.පුෂ්පකුමාර සොයිසා	41/7,සාගර මාවත,පාණදුර	3000.00
15	මාළු 01	එළවලු	එම්.ධර්මසිරි ප්‍රනාන්දු	15,ධීවර නිවාස, උයන්කැලේ,පාණදුර	3000.00
16	මාළු 02	අලලූණු	ජේ.බී.බුද්ධික අශෝක් කුමාර	13/2 ජයතිලක මාවත,පාණදුර	3000.00
17	මාළු 03	මාලු	ජේ.ප්‍රදීප් කුමාර	07,ජයතිලක මාවත,පාණදුර	5000.00
18	මාළු 04	මාලු	ජී.මහේෂ් සුදර්ශන	73/3 වෛද්‍ය මාවත,එගොඩ උයන	5000.00
19	මාළු 05	මාලු	දිලීප ප්‍රියදර්ශන	50/6, ජගත්පුර,මෝදර,මොරටුව	5000.00
20	මාළු 06	බිත්තර පොල්තෙල්	ඊ.එම්.අනුරුද්ධ ප්‍රියන්ත	242/5 A,ආතර් වී දියෙස් මාවත,පාණදුර	3000.00
21	මාළු 07	බිත්තර පොල්තෙල්	බී.ඩබ් අසංග උදය කුමාර	194, කුරුප්පුමුල්ල, පාණදුර	3000.00
22	මාළු 09	මාලු	එම්.අජිත් ප්‍රනාන්දු	07/1 නිර්මල මාවත,පාණදුර	5000.00
23	මාළු 10	මාලු	ජී.ඩැල්මන් ප්‍රනාන්දු	70, ජගත්පුර ,මෝදර, මොරටුව	5000.00
24	මාළු 11	මාලු	එම්.ලක්ෂමන් ප්‍රනාන්දු	4,ගුඩ්විල් වත්ත,මෝදර,මොරටුව	5000.00
25	මාළු 12	මාලු	ටී.ඩෙන්සිල් පීරිස්	27/2,මැල්වත්ත පාර,එළුවිල	5000.00
26	මාළු 13	මාලු	ජේ.එම්.දිස්නා කුමුදුනී	27/2,මැල්වත්ත පාර,එළුවිල	5000.00
27	මාළු 14	කොස්	බී.එච්.ඉදුනිල් ප්‍රසන්න පීරිස්	31/5 සාගර මාවත,පාණදුර	2000.00
28	මාළු 15	කෙසෙල්	එල්.ඒ.සමන්ත ප්‍රියනාත් සිල්වා	24/4 සාගර මාවත,පාණදුර	2000.00
29	මාළු 16	එළවලු	ඩබ්.කේ.ඒ.අශෝක ප්‍රනාන්දු	6/B/1/1 තට්ටු නිවාස සංකීර්ණය,මෝදරවිල,පාණදුර	2000.00
30	මාළු 17	කරවල	එල්.ඒ.තනුජා අමාලි	32/2 සාගර මාවත,පාණදුර	2000.00
31	මාළු 18	කරවල	තරංග දිල්ශාන්	32/2 සාගර මාවත,පාණදුර	3000.00
32	මාළු 19	පොල්තෙල්	ඩබ්.ජී.එම්.රවින්ද්‍ර කැලුම්	43 උයන්කැලේ හරස් පාර,උයන්කැලේ,පාණදුර	2000.00
33	මාළු 20	පළතුරු	එම්.ලයනල් ප්‍රනාන්දු	406/1 එගොඩ උයන,මොරටුව	2000.00

34	මාළු 21	බුලත්	රෝහණ වසන්ත විතානගේ පෙරේරා	339/C, වෙලගහවත්ත කුඩා අරුග්ගොඩ,අළුබෝමුල්ල	3000.00
35	මාළු 22	බුලත්	ඒ.පුබුදු මධුරංග ද සොයිසා	පුබුදු දෙල්දුව වාද්දුව	3000.00
36	මාළු 23	පොල්	එච්.චමිල ප්‍රියංකර සොයිසා	485 රින් ගහවත්ත,පඤ්ඤානන්ද මාවත,වැකඩ,පාණදුර	2000.00
37	මාළු 24	කොස්	ජී.එම්.ආර්.අපොන්සු	457/41 ධීවර කාර්යාල වත්ත,මෝදර,මොරටුව	2000.00
38	මාළු 25	ඉදල් කොසු	නෙල්කා ප්‍රියංගනීප්‍රනාන්දු	35/A සුජාතා මාවත,කෙසෙල් වත්ත,පාණදුර	2000.00
39	මාළු 26	මාලු	කේ.බී.එස්.හෙට්ටිආරච්චි	118/B, ගැමුණු මාවත,වලපල,පාණදුර	5000.00
40	මාළු 27	මාලු	එස්.ඩී.මනෝරි ද සිල්වා	මෛත්‍රී මාවත,3 වන පටුමඟ,වැල්මිල්ල හංදිය,වැල්මිල්ල	5000.00
41	මාළු 28	මාලු	ජී.එම්.ටෝලිනිසන්	28,සුනාමි වත්ත,කහටගහවත්ත,බණ්ඩාරගම	5000.00
42	මාළු 32	මාලු	ජී.අනුර ප්‍රනාන්දු	17/3 ගල්වැටිමෝදර පාර,නල්ලූරුව	5000.00

නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේදී කඩා ඉවත් කිරීමට ලක්නොවූ හඳුනාගත් කඩ 42 සඳහා ඉහත වගුවේ පරිදි ආදායම් පරීක්ෂක මහතුන් විසින් සිදුකර ඇති තාවකාලික තක්සේරුව පිළිගැනීමත් අදාළ තක්සේරුව අනුව දෛනික ගාස්තු අයකිරීමත් මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.4 පාණදුර,වැකඩ,හොරණ පාර,75/සී නිවසේ පදිංචි බී.ජී.ධම්මිකා යන අය විසින් භාවනා වැඩසටහනක් පැවැත්වීම සඳහා 2022.10.30 , 2022.12.11 දිනයන් වෙන් කර ඇත.ආගමික වැඩසටහනක් පැවැත්වීම වෙනුවෙන් මෙම වෙන් කිරීම සිදු කර ඇති නිසා සහනයක් ලබා දෙන ලෙස ඇය විසින් ඉල්ලා ඇත.රටේ පවත්නා ආර්ථික අර්බුදය නිසා නගර සභා ආදායම අඩු වී ඇති බැවින් සහනයක් ලබා දීම සම්බන්ධව මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

සභා ආදායම්ද අඩු වී ඇති බැවින් ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී.

2.5 පාණදුර,ගාළු පාර ,නො.500/3 බී ලිපිනයේ පෝසිලේන් ලංකා අයතනය මඟින් 2022.11.14 දින සිට 2023.01.05 දින දක්වා පුස්තකාල භූමියේ A කොටස හා B කොටස වෙන් කර ඇත.පුස්තකාල භූමිය වෙන් කිරීමේ ගාස්තුව පහත පරිදි දිනකට රු 11,400/= වේ.

A කොටස (කිරිහල ලඟ)	- රු 6200.00
B කොටස (පුස්තකාලය ඉදිරිපිට)	- රු 5200.00
	රු 11400.00

නමුත් පෝසිලේන් ලංකා ආයතනය මඟින් මෙම වෙන් කිරීම වෙනුවෙන් දිනකට රු 7000.00 ලෙස ගාස්තු ගෙවීමට සහනයක්ද සම්පූර්ණ මුදල වාරික 03 කින් ගෙවීමටද ඉල්ලීම් කර ඇත.රට මුහුණපා ඇති ආර්ථික දුෂ්කරතා නිසා නගර සභා ආදායම අඩු වී ඇති බැවින් ඉහත ඉල්ලීම පරිදි සහනයක් ලබා දීම සම්බන්ධව මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

කල්තබන ලදී.

2.6 පාණදුර නගර සභාව විසින් කුලියට දෙන පහත දේපළ හා වෙළඳ ප්‍රවර්ධන ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් ලබා දීමේදී දැරිය යුතු ජල,විදුලි බිල්පත් වැඩිවීම හා වර්තමානයේ පවතින ආර්ථික අර්බුදය හමුවේ සභා ආදායම අඩු වී ඇති බැවින් පහත ස්ථාන සම්බන්ධයෙන් දැනට අයකරනු ලබන ගාස්තු සංශෝධනයට මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

1. පුස්තකාල පොළ භූමිය
2. පුස්තකාල ශ්‍රවණාගාරය
3. ජයතිලක උද්‍යානය
4. වෙරළ තීරය වෙන් කිරීම
5. මිනුවන්පිටිය සුසාන භූමිය
6. නගර ශාලාව වෙන් කිරීම
7. එළිමහන් පොළ භූමිය
8. ක්‍රීඩා භූමිය
9. වෙළඳ ප්‍රවර්ධන හා ප්‍රචාරණ කටයුතු

2.6.1 පාණදුර නගර සභාව සතු මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි අනුස්මරණ මහජන පුස්තකාලය ඉදිරිපිට ඇති පුස්තකාල පොළ භූමිය දිනකට වෙන් කිරීමේ ගාස්තු සංශෝධනය සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

	දැනට පවතින ගාස්තුව	සංශෝධිත විය යුතු ගාස්තුව
එහි A කොටස සඳහා	රු.6,200.00	රු 7000.00
එහි B කොටස සඳහා	රු.5,200.00	රු 7000.00
අයදුම්පත්‍ර ගාස්තුව	රු. 500.00	රු 750.00
තැන්පතුව	රු.1,000.00	රු 2000.00

පහත පරිදි ගාස්තු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

	අයකිරීමට නිර්දේශිත ගාස්තුව(දෛනික)
එහි A කොටස සඳහා	**රු 7000.00**
එහි B කොටස සඳහා	**රු 7000.00**
අයදුම්පත්‍ර ගාස්තුව	**රු 750.00**
තැන්පතුව	**රු 2000.00**
විදුලිය හා ජලය සඳහා වූ ගාස්තුව	**රු 4500.00**

2.6.2 මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි අනුස්මරණ මහජන පුස්තකාලයේ ශ්‍රවනාගාරය වෙන් කිරීමේ ගාස්තු පහත පරිදි සංශෝධනය සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

	දැනට පවතින ගාස්තුව	සංශෝධිත විය යුතු ගාස්තුව
දිනකට රැස්වීමක් සඳහා	රු. 3,000.00	රු 4000.00
තැන්පතුව	රු. 1,500.00	රු 2500.00

පහත පරිදි ගාස්තු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

	අයකිරීමට නිර්දේශිත ගාස්තුව(දෛනික)
දිනකට රැස්වීමක් සඳහා	**රු 4000.00**
තැන්පතුව	**රු 2500.00**
විදුලිය හා ජලය සඳහා වූ ගාස්තුව	**රු 1500.00**

2.6.3 ජයතිලක උද්‍යානය වෙන් කිරීමේ ගාස්තු පහත පරිදි සංශෝධනය සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

ස්ථානය	කාරණය	දැනට පවතින ගාස්තු		සංශෝධිත විය යුතු ගාස්තුව	
		ගාස්තුව (අවම පැය 04 සඳහා)	තැන්පතු	ගාස්තුව (අවම පැය 04 සඳහා)	තැන්පතුව
ළමා උද්‍යානය	ප්‍රිය සම්භාෂණ සඳහා (පැයකට රු. 750.00)	රු 2000.00	රු 5000.00	රු 3000.00	රු 7500.00
	රූගත කිරීම් , ටෙලි නාට්‍යහා වෙළඳ ප්‍රචාරණය සඳහා (පැයකට රු. 850.00)	රු 2400.00	_	රු 3400.00	_
	මංගල හා උපන් දින උත්සව, ඡායාරූප ගැනීම (පැයකට රු. 550.00)	රු 1200.00	_	රු 2200.00	_
ළමා උද්‍යානයේ ශාලාව	ප්‍රිය සම්භාෂණ (පැයකට රු. 750.00)	රු 2000.00	රු 5000.00	රු 3000.00	රු 7500.00

කාරණය	දැනට පවතින ගාස්තු	සංශෝධනය විය යුතු ගාස්තු
විදුලිය සඳහා	රු 500.00	රු 900.00

ඉහත වෙන් කිරීම් සඳහා පැය 04 ඉක්මවා ලබා ගන්නේ නම් වැඩිවන සෑම පැයකටම අදාළ ගාස්තු අය කරන අතර කසල ප්‍රමාණය අනුව වෙනම ගාස්තුවක් අයකෙරේ.

පහත පරිදි ගාස්තු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

ස්ථානය	කාරණය	නිර්දේශ කරන ලද ගාස්තුව	
		ගාස්තුව (අවම පැය 04 සඳහා)	තැන්පතුව
ළමා උද්‍යානය	ප්‍රිය සම්භාෂණ සඳහා (පැයකට රු. 750.00)	රු 3000.00	රු 7500.00
	රූගත කිරීම් , ටෙලි නාට්‍යහා වෙළඳ ප්‍රචාරණය සඳහා (පැයකට රු. 850.00)	රු 3400.00	_
	මංගල හා උපන් දින උත්සව, ඡායාරූප ගැනීම (පැයකට රු. 550.00)	රු 2200.00	_
ළමා උද්‍යානයේ ශාලාව	ප්‍රිය සම්භාෂණ (පැයකට රු. 750.00)	රු 3000.00	රු 7500.00
	විදුලිය සඳහා	රු 900.00	

ඉහත වෙන් කිරීම් සඳහා පැය 04 ඉක්මවා ලබා ගන්නේ නම් වැඩිවන සෑම පැයකටම අදාළ ගාස්තු අය කිරීමත් කසල ප්‍රමාණය අනුව වෙනම ගාස්තුවක් අයකිරීමත් මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.6.4 වෙරළ තීරය වෙන් කිරීමේ ගාස්තු පහත පරිදි සංශෝධනය සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

කාරණය	දැනට පවතින ගාස්තු		සංශෝධනය විය යුතු ගාස්තු	
	ගාස්තුව(රු)	තැන්පතුව (රු)	ගාස්තුව (රු)	තැන්පතුව (රු)
පාණදුර බල ප්‍රදේශයේ ක්‍රීඩා සමාජය	4500.00	5000.00	5500.00	6000.00
වෙනත් ක්‍රීඩා සමාජය	6500.00	5000.00	8000.00	6000.00
සංගීත ප්‍රසංග	14500.00	5000.00	16000.00	7000.00
වෙළඳ ප්‍රවර්ධන	9500.00	5000.00	11000.00	7000.00
රූගත කිරීම්	6500.00	5000.00	8000.00	6500.00
දේශපාලන රැස්වීම්	5500.00	5000.00	7000.00	6500.00
සැණකෙළි හා උත්සව	17500.00	10000.00	19000.00	12000.00
නගර සීමාවේ ඇති පාසැල්	2100.00	5000.00	3000.00	5500.00
හෙලිකොප්ටර් යානාවක් බිම්ගතකිරීම	17500.00	15000.00	19000.00	17000.00

කාරණය	දැනට පවතින ගාස්තු (රු)	සංශෝධනය විය යුතු ගාස්තු(රු)
සංගීත ප්‍රසංගයක් සඳහා අයකරනු ලබන බලපත්‍ර ගාස්තුව	500.00	750.00
විදුලි ගාස්තු (දහවල් කාලය සඳහා)	1000.00	1800.00
විදුලි ගාස්තු (රාත්‍රී කාලය සඳහා)	2500.00	4500.00
එළිමහන් වේදිකාව ලබාදීම	5000.00	6000.00

පහත පරිදි ගාස්තු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

කාරණය	නිර්දේශ කරන ලද ගාස්තු	
	ගාස්තුව (රු)	තැන්පතුව (රු)
පාණදුර බල ප්‍රදේශයේ ක්‍රීඩා සමාජය	5500.00	6000.00
වෙනත් ක්‍රීඩා සමාජය	8000.00	6000.00
සංගීත ප්‍රසංග	16000.00	7000.00
වෙළඳ ප්‍රවර්ධන	11000.00	7000.00
රූගත කිරීම්	8000.00	6500.00
දේශපාලන රැස්වීම්	7000.00	6500.00
සැණකෙළි හා උත්සව	19000.00	12000.00
නගර සීමාවේ ඇති පාසැල්	3000.00	5500.00

හෙලිකොප්ටර් යානාවක් බිම්ගතකිරීම	25000.00	17000.00

කාරණය	නිර්දේශ කරන ලද ගාස්තුව
සංගීත ප්‍රසංගයක් සඳහා අයකරනු ලබන බලපත්‍ර ගාස්තුව	750.00
විදුලි ගාස්තු (දහවල් කාලය සඳහා)	1800.00
විදුලි ගාස්තු (රාත්‍රී කාලය සඳහා)	4500.00
එළිමහන් වේදිකාව ලබාදීම	6000.00

2.6.5 මිනුවම්පිටිය සුසාන භූමිය වෙන් කිරීමේ ගාස්තු පහත පරිදි සංශෝධනය සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

කාරණය	දැනට පවතින ගාස්තුව		සංශෝධිත විය යුතු ගාස්තුව	
	ගාස්තුව(රු.)	තැන්පතුව(රු)	ගාස්තුව(රු.)	තැන්පතුව(රු)
රූගත කිරීම් සඳහා දිනකට	3,000.00	3,000.00	4000.00	4000.00
විදුලිය සඳහා	500.00	-	900.00	_

- තැන්පතු මුදල ඉක්මවා අලාභයක් සිදුවුවහොත් එම මුදල් ගෙවිය යුතුවේ.

පහත පරිදි ගාස්තු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

කාරණය	නිර්දේශිත ගාස්තුව	
	ගාස්තුව(රු.)	තැන්පතුව(රු)
රූගත කිරීම් සඳහා දිනකට	4000.00	4000.00
විදුලිය සඳහා	900.00	_

තැන්පතු මුදල ඉක්මවා අලාභයක් සිදුවුවහොත් එම මුදල් ගෙවිය යුතුවේ

2.6.6 නගර ශාලාව වෙන් කිරීමේ ගාස්තු පහත පරිදි සංශෝධනය සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

<u>දැනට පවතින ගාස්තු</u>

කාරණය	Ac/sound /light නොගන්නා විට රු.	ගාස්තුව රු.	විදුලිය රු.	වායු සමීකරණය රු.	ශබ්දවිකාශනගාස්තු රු.	ආලෝක කරණය රු.	එකතුව රු.
වෙළඳ ප්‍රදර්ශන නාට්‍ය/සංගීත	15,100.00	14,500.00	3,000.00	11,000.00	4,000.00	3,500.00	36,000.00
මංගල උත්සව	12,250.00	12,000.00	3,000.00	11,000.00	4,000.00	3,500.00	33,500.00
පාසල්	4,125.00	4,000.00	3,000.00	11,000.00	4,000.00	3,500.00	25,500.00
පෙර පාසල්	6,850.00	6,500.00	3,000.00	11,000.00	4,000.00	3,500.00	28,000.00
ජාත්‍යන්තර පාසල්	11,250.00	12,000.00	3,000.00	11,000.00	4,000.00	3,500.00	33,500.00
දේශපාලන රැස්වීම්	5,850.00	6,500.00	3,000.00	11,000.00	4,000.00	3,500.00	28,000.00
ආගමික රැස්වීම්	4,125.00	4,000.00	3,000.00	11,000.00	4,000.00	3,500.00	25,500.00
රාජ්‍ය ආයතන	4,387.00	4,250.00	3,000.00	11,000.00	4,000.00	3,500.00	25,750.00
කලායතන/ ප්‍රදර්ශන	6,850.00	6,500.00	3,000.00	11,000.00	4,000.00	3,500.00	28,000.00
වෙනත් සම්මන්ත්‍රණ	10,250.00	10,000.00	3,000.00	11,000.00	4,000.00	3,500.00	31,500.00

සංශෝධනය විය යුතු ගාස්තු

කාරණය	Ac/sound /light නොගන්නා විට(රු.)	ගාස්තුව රු.	විදුලිය රු.	වායු සමීකරණය රු.	ශබ්දවිකාශනගාස්තු රු.	ආලෝක කරණය රු.	එකතුව රු.
වෙළඳ ප්‍රදර්ශන නාට්‍ය/සංගීත	16100.00	15000.00	5400.00	19800.00	7200.00	8100.00	55,500.00
මංගල උත්සව	13250.00	13000.00	5400.00	19800.00	7200.00	8100.00	53,500.00
පාසල්	5125.00	5000.00	5400.00	19800.00	7200.00	8100.00	45,500.00
පෙර පාසල්	7850.00	7500.00	5400.00	19800.00	7200.00	8100.00	48;000.00
ජාත්‍යන්තර පාසල්	13250.00	13000.00	5400.00	19800.00	7200.00	8100.00	53,500.00
දේශපාලන රැස්වීම්	7850.00	7500.00	5400.00	19800.00	7200.00	8100.00	48,000.00
ආගමික රැස්වීම්	5125.00	5000.00	5400.00	19800.00	7200.00	8100.00	45,500.00
රාජ්‍ය ආයතන	5387.00	5250.00	5400.00	19800.00	7200.00	8100.00	45,750.00
කලායතන/ ප්‍රදර්ශන	7850.00	7500.00	5400.00	19800.00	7200.00	8100.00	48,000.00
වෙනත් සම්මන්ත්‍රණ	12500.00	12000.00	5400.00	19800.00	7200.00	8100.00	52,500.00

කාරණය	දැනට අයකරන ගාස්තු (රු)	සංශෝධනය විය යුතු ගාස්තු (රු)
• ආපසු ගෙවන තැන්පතු මුදල පෙර පාසල් පෙර පුහුණු ගාස්තුවෙන් භාගයක් අය කල යුතුය	5000.00	6000.00
මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර්	4500.00	5500.00
රතු පලස වෙන්කිරීම සඳහා	2500.00	3500.00
අමතර NORMAL MIC 1ක් සඳහා	550.00	650.00
නාට්‍ය,සංගීතසංදර්ශනය හා විවිධ ප්‍රසංග සඳහා	500.00	600.00
SMOKE LIGHT සඳහා දිනකට	4000.00	5000.00
BUBBLES LIGHT සඳහා දිනකට	4000.00	5000.00
අමතර FM MIC එකක් සඳහා දිනකට	1000.00	2000.00

පහත පරිදි ගාස්තු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

කාරණය	Ac/sound /light නොගන්නා විට(රු.)	ගාස්තුව රු.	විදුලිය රු.	වායු සමීකරණය රු.	ශබ්දවිකාශ නගාස්තු රු.	ආලෝක කරණය රු.	එකතුව රු.
වෙළඳ ප්‍රදර්ශන නාට්‍ය/සංගීත	16100.00	15000.00	5400.00	19800.00	7200.00	8100.00	55,500.00
මංගල උත්සව	13250.00	13000.00	5400.00	19800.00	7200.00	8100.00	53,500.00
පාසල්	5125.00	5000.00	5400.00	19800.00	7200.00	8100.00	45,500.00
පෙර පාසල්	7850.00	7500.00	5400.00	19800.00	7200.00	8100.00	48,000.00
ජාත්‍යන්තර පාසල්	13250.00	13000.00	5400.00	19800.00	7200.00	8100.00	53,500.00
දේශපාලන රැස්වීම්	7850.00	7500.00	5400.00	19800.00	7200.00	8100.00	48,000.00
ආගමික රැස්වීම්	5125.00	5000.00	5400.00	19800.00	7200.00	8100.00	45,500.00
රාජ්‍ය ආයතන	5387.00	5250.00	5400.00	19800.00	7200.00	8100.00	45,750.00
කලායතන/ ප්‍රදර්ශන	7850.00	7500.00	5400.00	19800.00	7200.00	8100.00	48,000.00
වෙනත් සම්මන්ත්‍රණ	12500.00	12000.00	5400.00	19800.00	7200.00	8100.00	52,500.00

කාරණය	නිර්දේශිත ගාස්තු(රු)
• ආපසු ගෙවන තැන්පතු මුදල පෙර පාසල් පෙර පුහුණු ගාස්තුවෙන් භාගයක් අය කල යුතුය	6000.00
මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර්	5500.00
රතු පලස වෙන්කිරීම සඳහා	3500.00

අමතර NORMAL MIC 1ක් සඳහා	650.00
නාට්‍ය,සංගීතසංදර්ශනය හා විවිධ ප්‍රසංග සඳහා	600.00
SMOKE LIGHT සඳහා දිනකට	5000.00
BUBBLES LIGHT සඳහා දිනකට	5000.00
අමතර FM MIC එකක් සඳහා දිනකට	2000.00

2.6.7 නගර ශාලාව අසල එළිමහන් වේදිකාව ඉදිරිපිට පිහිටි එළිමහන් පොළ භූමිය වෙන් කිරීමේ ගාස්තු පහත පරිදි සංශෝධනය කිරීමට මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

අයිතමය	දැනට පවතින ගාස්තුව		සංශෝධිත විය යුතු ගාස්තුව	
	ගාස්තුව රු.	විදුලිය රු.	ගාස්තුව රු.	විදුලිය රු.
දේශපාලනරැස්වීම්	2,100.00	1,450.00	3100.00	2610.00
සංගීත සංදර්ශන	3,200.00	2,800.00	4200.00	5040.00
ආගමික රැස්වීම්	2,100.00	1,100.00	3100.00	1980.00
පාසල්	2,100.00	1,100.00	3100.00	1980.00
පෙර පාසල්	2,700.00	1,100.00	3700.00	1980.00
වෙළඳප්‍රවර්ධන	6,500.00	2,200.00	7500.00	3960.00
සුභ සාධක සංගම් (උත්සව)	2,100.00	1,450.00	3100.00	2610.00
වෙළඳ සල්පිල්ව්‍යාපාරික	9,000.00	2,200.00	10000.00	3960.00
රාජ්‍ය	8,500.00	2,200.00	9500.00	3960.00
වෙළඳ සල්පිල් ව්‍යාපාරික නොවන	8,000.00	2,200.00	9000.00	3960.00
රාජ්‍ය ආයතන	2,100.00	1,450.00	3100.00	2610.00

කාරණය	දැනට අයකරන ගාස්තු(රු)	සංශෝධනය විය යුතු ගාස්තු (රු)
ඉහත අවස්ථා සඳහා ආරක්ෂිත ඇප තැන්පතුව	1000.00	2000.00
බලපත්‍ර ගාස්තුව	500.00	750.00
මල් ප්‍රදර්ශන සඳහා ජල ගාස්තු එක් දිනකට	350.00	550.00

පහත පරිදි ගාස්තු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

අයිතමය	නිර්දේශිත ගාස්තුව	
	ගාස්තුව රු.	විදුලිය රු.
දේශපාලනරැස්වීම්	3100.00	2650.00
සංගීත සංදර්ශන	4200.00	5050.00
ආගමික රැස්වීම්	3100.00	2000.00
පාසල්	3100.00	2000.00
පෙර පාසල්	3700.00	2000.00
වෙළඳප්‍රවර්ධන	7500.00	4000.00
සුභ සාධක සංගම් (උත්සව)	3100.00	2650.00
වෙළඳ සල්පිල්ව්‍යාපාරික	10000.00	4000.00
රාජ්‍ය	9500.00	4000.00
වෙළඳ සල්පිල් ව්‍යාපාරික නොවන	9000.00	4000.00
රාජ්‍ය ආයතන	3100.00	2650.00

කාරණය	නිර්දේශිත ගාස්තු (රු)
ඉහත අවස්ථා සඳහා ආරක්ෂිත ඇප තැන්පතුව	2000.00
බලපත්‍ර ගාස්තුව	750.00
මල් ප්‍රදර්ශන සඳහා ජල ගාස්තු එක් දිනකට	550.00

2.6.8 ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීමට අය කරන ගාස්තු වක්‍රය පහත පරිදි සංශෝධනය කිරීමට මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

	ක්‍රීඩා භූමියේ නම	දැනට පවතින ගාස්තුව		සංශෝධිත විය යුතු මුදල	
		ගාස්තුව (දිනකට) (රු.)	තැන්පත් මුදල (රු.)	ගාස්තුව (දිනකට) (රු.)	තැන්පත් මුදල (රු.)
01.	පාණදුර ක්‍රීඩාපිටිය				
	පාසල් උත්සව සඳහා	2500.00	1500.00	4000.00	2500.00
	පාසල් ක්‍රීඩා උත්සව සඳහා	2500.00	10000.00	4000.00	12500.00
	පාසල් දිවා රාත්‍රී ක්‍රීඩා තරඟ සඳහා	2500.00	25000.00	4000.00	27000.00
	- ජාත්‍යන්තර පාසල්	6000.00	1500.00	7500.00	2500.00
	- පාණදුර බල ප්‍රදේශයට අයත් ක්‍රීඩා සමාජ	3000.00	5000.00	4500.00	6500.00
	- වෙනත්ක්‍රීඩා සමාජ	6000.00	5000.00	7500.00	6500.00
	- රාජ්‍ය ආයතන	4000.00	5000.00	5500.00	6500.00
	- වෙනත්	6000.00	5000.00	7500.00	6500.00
	- හෙලිකොප්ටර් යානාවක් බිම් ගත කිරීමට	17000.00	15000.00	18500.00	16500.00
02	තන්තිරිමුල්ල ක්‍රීඩාපිටිය	1500.00	_	3000.00	_
	විදුලිය සඳහා	500.00	_	900.00	1000.00

කාරණය	දැනට අයකරන ගාස්තු	සංශෝධනය විය යුතු ගාස්තු
බලපත්‍ර ගාස්තුව	500.00	750.00

පහත පරිදි ගාස්තු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

	ක්‍රීඩා භූමියේ නම	නිර්දේශිත මුදල	
		ගාස්තුව (දිනකට) (රු.)	තැන්පත් මුදල (රු.)
01.	පාණදුර ක්‍රීඩාපිටිය		
	පාසල් උත්සව සඳහා	4000.00	2500.00
	පාසල් ක්‍රීඩා උත්සව සඳහා	4000.00	12500.00
	පාසල් දිවා රාත්‍රී ක්‍රීඩා තරඟ සඳහා	4000.00	27000.00
	- ජාත්‍යන්තර පාසල්	7500.00	2500.00
	- පාණදුර බල ප්‍රදේශයට අයත් ක්‍රීඩා සමාජ	4500.00	6500.00
	- වෙනත්ක්‍රීඩා සමාජ	7500.00	6500.00
	- රාජ්‍ය ආයතන	5500.00	6500.00
	- වෙනත්	7500.00	6500.00
	- හෙලිකොප්ටර් යානාවක් බිම් ගත කිරීමට	25000.00	17000.00
02	තන්තිරිමුල්ල ක්‍රීඩාපිටිය	3000.00	_
	විදුලිය සඳහා	900.00	1000.00

කාරණය	නිර්දේශිත ගාස්තු
බලපත්‍ර ගාස්තුව	750.00

2.6.9 වෙළඳ ප්‍රවර්ධන ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් ගාස්තු අය කිරීම පහත පරිදි සංශෝධනය කිරීමට මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

අයිතමය	දැනට පවතින ගාස්තුව	සංශෝධිත විය යුතු ගාස්තුව
	ගාස්තුව රු.	ගාස්තුව රු.
වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන්/ ප්‍රචාරණය (ශබ්ද විකාශනය) වෙනුවෙන් නගර සභා අවසරය නොමැති වෙනත් ස්ථාන සඳහා බලපත්‍ර ගාස්තුව	3,000.00 500.00	4500.00 750.00
වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් / ප්‍රචාරණය (ශබ්ද විකාශනය) වෙනුවෙන් නගර සභා අවසරය සහිත භූමි සඳහා (බලපත්‍ර ගාස්තුව පමණි)	500.00	750.00
ආගමික ස්ථාන හා පාසල් මඟින් සිදු කරනු ලබන ප්‍රවර්ධන /ප්‍රචාරණ කටයුතු සඳහා (ආගමික ස්ථාන හා පාසල් ව්‍යාපාරික අරමුණින් ඉටු කරන්නේ නම් ඉහත පරිදි ගාස්තු අය කෙරේ.)	ගාස්තුවක් අය නොකෙරේ.	_

පහත පරිදි ගාස්තු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

අයිතමය	නිර්දේශිත ගාස්තු
	ගාස්තුව රු.
වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන්/ ප්‍රචාරණය (ශබ්ද විකාශනය) වෙනුවෙන් නගර සභා අවසරය නොමැති වෙනත් ස්ථාන සඳහා **බලපත්‍ර ගාස්තුව**	**4500.00** **750.00**
වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් / ප්‍රචාරණය (ශබ්ද විකාශනය) වෙනුවෙන් නගර සභා අවසරය සහිත භූමි සඳහා **(බලපත්‍ර ගාස්තුව පමණි)**	**750.00**
ආගමික ස්ථාන හා පාසල් මඟින් සිදු කරනු ලබන ප්‍රවර්ධන /ප්‍රචාරණ කටයුතු සඳහා **(ආගමික ස්ථාන හා පාසල් ව්‍යාපාරික අරමුණින් ඉටු කරන්නේ නම් ඉහත පරිදි ගාස්තු අය කෙරේ.)**	**ගාස්තු අයනොකෙරේ**

2.7 2023 වර්ෂය සඳහා පාණදුර නගර සභාව සතු පහත සඳහන් දේපළ බදු දීම් සඳහා ලංසු වටිනාකම් වරලත් තක්සේරුකරුවෙකුගේ ආසන්න මාස 03 ක් ඇතුළත ලබාගත් තක්සේරු වාර්තාවක් පදනම්ව කටයුතු කළ යුතුය.එම වාර්තාව ලබාගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

නමුත් 2022 වර්ෂය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති තක්සේරු වටිනාකම් ඉදිරි වර්ෂ 02 කට බලපැවැත්වෙන ලෙස ලබාදී ඇති බැවින් පහත 1-6 දක්වා වූ අයිතමයන් එම තක්සේරුව පදනම්වත් 7-9 දක්වා වූ අයිතමයන් ආදායම් පරීක්ෂක නිර්දේශ පදනම්වත් ලබාගෙන ඇත.

ඒ අනුව පහත අයිතමයන් වාර්ෂික පදනමින් බදු දීම සඳහාත් ඒ සඳහා වූ ලංසු පෝරම ගාස්තුව රු 1500.00 ක් ලෙසත් ලංසු තැන්පත් මුදල හා අවම ලංසු මුදල පහත පරිදි තීරණය කිරීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

අනු අංකය	බදු දෙන දේපළ	2022 වර්ෂය සඳහා වූ අවම ලංසුව(රු)	2022 වර්ෂයේ ඉල්ලුම් කල මුදල(රු)	2023 වර්ෂය සඳහා යෝජිත අවම ලංසු වටිනාකම (රු)	2023 වර්ෂය සඳහා යෝජිත ලංසු තැන්පතු මුදල (රු)
01	මාර්කට් පාර එල් 03 කඩ කාමරය	228,000.00	300,000.00	231,000.00	15,000.00
02	මාර්කට් පාර එල් 04 කඩ කාමරය	228,000.00	_	231,000.00	15,000.00
03	මාර්කට් පාර එල් 05 කඩ කාමරය	_	_	231,000.00	15,000.00
04	මාර්කට් පාර එල් 20 කඩ කාමරය	_	_	318,000.00	15,000.00
05	මාර්කට් පාර එල් 21 කඩ කාමරය	_	_	318,000.00	15,000.00
06	පිහිණුම් තටාක ආපන ශාලාව	144,000.00	_	156,000.00	5000.00
07	වෙරළ තීරයේ අයිස්ක්‍රීම් වෙළඳාම් කිරීමේ	1,349,990.00	1,350,990.00	1,500,000.00	25,000.00
08	ඔරලෝසු කණුව වෙළඳ ප්‍රචාරණය සඳහා බදු දීම	100,000.00	_	150,000.00	5,000.00
09	නගර ශාලාවේ ක්‍රීඩා පිටියට මුහුණලා ඇති බිත්තිය වෙළඳ ප්‍රදර්ශනය සඳහා බදුදීම	86,000.00	_	100,000.00	5,000.00

පහත දේපළ වාර්ෂික පදනමින් බදු දීමත් ඒ සඳහා වූ ලංසු පෝරම ගාස්තුව වශයෙන් රු 1500.00 ක් අයකිරීමත් පහත පරිදි ගාස්තු අයකිරීමත් මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

අනු අංකය	බදු දෙන දේපළ	2023 වර්ෂය සඳහා අවම ලංසු වටිනාකම (රු)	2023 වර්ෂය සඳහා ලංසු තැන්පතු මුදල (රු)
01	මාර්කට් පාර එල් 03 කඩ කාමරය	231,000.00	15,000.00
02	මාර්කට් පාර එල් 04 කඩ කාමරය	231,000.00	15,000.00
03	මාර්කට් පාර එල් 05 කඩ කාමරය	231,000.00	15,000.00
04	මාර්කට් පාර එල් 20 කඩ කාමරය	318,000.00	15,000.00
05	මාර්කට් පාර එල් 21 කඩ කාමරය	318,000.00	15,000.00
06	පිහිණුම් තටාක ආපන ශාලාව	156,000.00	5000.00
07	වෙරළ තීරයේ අයිස්ක්‍රීම් වෙළඳාම් කිරීමේ	1,500,000.00	25,000.00
08	ඔරලෝසු කණුව වෙළඳ ප්‍රචාරණය සඳහා බදු දීම	150,000.00	5,000.00
09	නගර ශාලාවේ ක්‍රීඩා පිටියට මුහුණලා ඇති බිත්තිය වෙළඳ ප්‍රදර්ශනය සඳහා බදුදීම	100,000.00	5,000.00

03. <u>ආයතනඅංශය</u>

3.1 පාන/01/09/01/2019 ලිපි ගොනුවට අදාලව 2022 ජූලි මස සඳහා කාර්යාලයේ දුරකථන බිල්පත් ගාස්තු පහත සඳහන් වේ. සභා ආවරණ අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත රු.**22,604.92** ක ගෙවූ මුදල , මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

සංකේත අංකය	දුරකථන අංකය	නම	කාල සීමාව	ගාස්තුව
124-1-1-0-1401	038-2232656	සභාපති කාර්යාලය	2022.07.01 සිට 2022.07.31	2589.48
	038-2249956	ලේකම්	2022.07.01 සිට 2022.07.31	333.96

	038-2232276	ෆැක්ස්/ඉන්ටර්නෙට්	2022.07.01 සිට 2022.07.31	8326.10
	038-2232285	උප සභාපති කාර්යාලය	2022.07.01 සිට 2022.07.31	1445.75
	038-3124635	පරිපාලන නිලධාරී	2022.07.01 සිට 2022.07.31	524.42
	038-2248477	ආයතන අංශය	2022.07.01 සිට 2022.07.31	1798.65
124-3-5-3-1401	038-2241705	ආයුර්වේදය	2022.07.01 සිට 2022.07.31	740.23
124-8-1-0-1401	038-2221422	කසල අංගණය	2022.07.01 සිට 2022.07.31	474.68
124-4-3-0-1401	038-3127580	සූර්ය පැනලයේ රවුටරය	2022.07.01 සිට 2022.07.31	18.37
124-2-1-01-1401	038-2249957	වරිපනම් අංශය	2022.07.01 සිට 2022.07.31(PEO TV ලබාගත් බැවින් එම මුදල මෙම දුරකථනයට එකතු කරන ලදී.)	2354.28
124-6-3-0-1401	038-2243299	පුස්තකාලය	2022.07.01 සිට 2022.07.31	3337.54
	038-3120069	ප්‍රජා සංවර්ධන අංශය	2022.07.01 සිට 2022.07.31	661.46
			එකතුව	**22604.92**

රු.22,604.92 ක මුදල, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

3.2 පාන/01/09/01/2019 ලිපි ගොනුවට අදාලව 2022 ජූලි මස සඳහා කාර්යාලයේ දුරකථන බිල්පත් ගාස්තු පහත සඳහන් වේ. සභා ආවරණ අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත **රු.16,211.65** ක ගෙවූ මුදල , මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

සංකේත අංකය	දුරකථන අංකය	නම	කාල සීමාව	ගාස්තුව
124-1-1-0-1401	038-3126384	කමිටු කාමරය	2022.07.16 සිට 2022.08.15	524.42
	038-2249955	අභ්‍යන්තර විගණන නිළධාරී	2022.07.16 සිට 2022.08.15	227.25
124-1-2-0-1401	038-3127416	ගිණුම් අංශය	2022.07.16 සිට 2022.08.15	800.42
	038-2249953	සැපයුම් නිළධාරී කාර්යාලය	2022.07.16 සිට 2022.08.15	1104.15
124-8-1-0-1401	038-3126174	කසල අංගණය රවුටරය	2022.07.16 සිට 2022.08.15	1702.85
124-4-3-0-1401	038-2249954	වැඩ අධිකාරී කාර්යාලය	2022.07.16 සිට 2022.08.15	758.43
	038-2249950	කර්මාන්ත අංශය	2022.07.16 සිට 2022.08.15	1761.19
	038-3370564	පිහිනුම් තටාකය	2022.07.16 සිට 2022.08.15	1054.26
	038-3127405	නගර ශාලාව	2022.07.16 සිට 2022.08.15	1186.83
	038-3397714	වැඩ අංගනයේ කාර්යාලය	2022.07.16 සිට 2022.08.15	2026.35
124-3-1-0-1401	038-2249952	සෞඛ්‍ය අංශය	2022.07.16 සිට 2022.08.15	1765.59
	038-3127406	මිනුවම්පිටිය සුසාන භූමිය	2022.07.16 සිට 2022.08.15	1083.32
124-2-1-01-1401	038-2249951	මිශ්‍ර ආදායම් අංශය	2022.07.16 සිට 2022.08.15	2216.59
			එකතුව	**16211.65**

රු.16,211.65 ක මුදල, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

3.3 PUC/1/3/2/18/2021 ලිපි ගොනුවට අනුව පාණදුර නගර සභාවේ යොදවා ඇති බස්නාහිර පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වෙස්ප්‍රෝ ආයතනයේ ආරක්ෂක නිලධාරීන් සඳහා 2022 අගොස්තු මස දීමනා ගෙවීම වෙනුවෙන් සභා ආවරණ අනුමැතියට යටත්ව, එකී ආයතනය වෙත ගෙවන ලද රු.471,820.00 ක මුදල, මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

වෙස්ප්‍රෝ ආයතනය වෙත ගෙවූ රු 471,820.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

3.4 පාන/01/09/23/2021 ලිපිගොනුවට අදාලව මුද්දර යන්ත්‍රය සඳහා මුද්දර ඇතුලත් කර ගැනීමට පෝස්ට් මාස්ටර් ජනරාල් වෙත සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද රු 50,000.00 ක මුදල,මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

පෝස්ට් මාස්ටර් ජනරාල් වෙත රු 50,000.00 ක මුදල ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

04. <u>සෞඛ්‍ය අංශය</u>

4.1 UCP/06/02/13/2021ලිපි ගොණුවට අනුව 2022.05.03 – 2022.05.31 දින දක්වා පාණදුර නගර සභා බල ප්‍රදේශයේ එකතු කරන ලද දිරන කසළ මෙට්‍රික් ටොන් 217.918 ක් ඉවත් කිරීම වෙනුවෙන් සභා ආවරණ අනුමැතියට යටත්ව කළුතර පොහොර වත්ත කසල ව්‍යාපෘතිය වෙත නව ගිවිසුමට අනුව ගෙවන ලද හිඟ මුදල වන රු.183,051.12 මුදල, මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

2022.05.03 – 2022.05.31 දින දක්වා කසළ මෙ.ටොන්. 217.918 * 750/-		= රු. 163,438.50
	12 % VAT	= <u>රු. 19,612.62</u>
		<u>රු. 183,051.12</u>

කළුතර පොහොර වත්ත කසල ව්‍යාපෘතිය වෙත ගෙවන ලද රු 183,051.12 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.2 UCP/06/02/13/2021ලිපි ගොණුවට අනුව 2022.06.01 – 2022.06.30 දින දක්වා පාණදුර නගර සභා බල ප්‍රදේශයේ එකතු කරන ලද දිරන කසළ මෙට්‍රික් ටොන් 233.729 ක් ඉවත් කිරීම වෙනුවෙන් සභා ආවරණ අනුමැතියට යටත්ව කළුතර පොහොර වත්ත කසල ව්‍යාපෘතිය වෙතගෙවන ලද මුදල වන රු.525,232.96 ක මුදල, මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

2022.06.01 – 2022.06.30 දින දක්වා කසළ මෙ.ටොන්. 233.729 * 2,000/-		= රු. 467,458.00
	තරාදි බර 50 * 30	= <u>රු. 1,500.00</u>
		රු 468,958.00
	12 % VAT	= <u>රු. 56,274.96</u>
		<u>රු. 525,232.96</u>

කළුතර පොහොර වත්ත කසල ව්‍යාපෘතිය වෙත ගෙවන ලද රු 525,232.96 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.3UCP/06/02/13/2021ලිපි ගොණුවට අනුව 2022.07.01 – 2022.07.31 දින දක්වා පාණදුර නගර සභා බල ප්‍රදේශයේ එකතු කරන ලද දිරන කසළ මෙට්‍රික් ටොන් 114.484 ක් ඉවත් කිරීම වෙනුවෙන් සභා ආවරණ අනුමැතියට යටත්ව කළුතර පොහොර වත්ත කසල ව්‍යාපෘතිය වෙතගෙවන ලද මුදල වන රු.257,284.16 ක මුදල, මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

2022.07.01 – 2022.07.31 දින දක්වා කසළ මෙ.ටොන්. 114.484 * 2,000/-		= රු. 228,968.00
	තරාදි බර 50 * 15	= <u>රු. 750.00</u>
		රු 229,718.00
	12 % VAT	= <u>රු. 27,566.16</u>
		<u>රු. 257,284.16</u>

කළුතර පොහොර වත්ත කසල ව්‍යාපෘතිය වෙත ගෙවන ලද රු 257,284.16 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.4 UCP/06/02/07/2022 ලිපි ගොනුවට අනුව 2022.07.01 – 2022.07.31 දක්වා පාණදුර නගර සභා බල ප්‍රදේශයේ එකතු කරන ලද දිරන කසළ ලෝඩ් 22 ක් ඉවත් කිරීම වෙනුවෙන් රු 34,500.00 බැගින් රු 759,000.00 ක මුදලක් ලබා දෙන ලෙස GFC Machinery (Pvt) Ltd ආයතනය විසින් ඉල්ලීම් කර ඇත.ඒ අනුව සභා ආවරණ අනුමැතියට යටත්ව GFC Machinery (Pvt) Ltd ආයතනය වෙත ගෙවන ලද රු. 759,000/- ක මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

GFC Machinery (Pvt) Ltd ආයතනය වෙත ගෙවන ලද රු. 759,000/- ක මුදල, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.5 UCP/06/03/02/2022 ලිපි ගොනුවට අනුව 2022.07.01 සිට 2022.07.31 දක්වා ගල්කිස්ස අපජල පද්ධතියට මළාපවහන මුදාහැරීම වෙනුවෙන් මළාපවහන ගාස්තු වශයෙන් , ලෝඩ් එකක් මුදාහැරීම සඳහා රු.2000/- බැගින් ලෝඩ් 17 ක් සඳහා රු.38,080/- (VAT සමඟ) ක මුදල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු.38,080/- (VAT සමඟ) ක මුදල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

<u>05. ගිණුම් අංශය</u>

5.1 puc/Ac7/ඇස/2011 ලිපිගොනුවට අදාළව සොලමන් මාවත,පිහිණුම් තටාකය සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර 02ක් මිලදී ගැනිම වෙනුවෙන් E.T. Lab Manufacturing (pvt) Ltd. ආයතනය වෙත රු.114,400.00 ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර, එම මුදල ,මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

Finger Scans Recorder- T-1800 38000.00 x2	=	76000.00
08Hr Backup 12450.00 x2	=	24900.00
Wood & Glass Protective Cover 6750.00 x2	=	13500.00
	=	114,400.00

E.T. Lab Manufacturing (pvt) Ltd. ආයතනය වෙත රු.114,400.00 ක් ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.2 puc/Ac7/G-01/2021 ලිපිගොනුවට අදාළව ගබඩාවෙන් කරන ලද ඉල්ලීම අනුව මිල ගණන් කැඳවා අවම මිල ඉදිරිපත් කරන ලද ආයතනයෙන් පරිගණක රිබන් හා ටෝනර් මිලදී ගැනිම වෙනුවෙන් මොරටුව,Silver line Ribbons වෙත රු.93,000.00ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

<u>2022.08.02</u>

LQ 2090 Compatible ribbon 2650.00 x20	=	53000.00
85A Toner Cartridge(1102) 8000.00 x5	=	40000.00
	=	93000.00

මොරටුව,Silver line Ribbons ආයතනය වෙත රු.93,000.00ක් ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.3 puc/Ac7/G-01/2021 ලිපිගොනුවට අදාළව ගබඩාවෙන් කරන ලද ඉල්ලීම අනුව මිලට ගත් ටෝනර් වෙනුවෙන් මොරටුව,Silver line Ribbons ආයතනය වෙත රු.320,000.00ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

<u>2022.07.25</u>

325 Toner Cartridge(6030) 8000.00 x20	=	160,000.00
ML 101 Toner Cartridge(2161) 8000.00 x20	=	160,000.00
	=	320,000.00

මොරටුව,Silver line Ribbons ආයතනය වෙත රු.320,000.00ක් ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.4 puc/Ac7/G-01/2021 ලිපිගොනුවට අදාළව ගබඩාවෙන් කරන ලද ඉල්ලීම අනුවගිණුම් අංශයේ වර්ණ ප්‍රින්ටරය සඳහා මිලට ගත් ටෝනර් වෙනුවෙන් මොරටුව,Silver line Ribbons ආයතනය වෙත රු.51,900.00ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

2022.08.15
TN 267 BK Toner 51900.00 x1 = 51900.00

මොරටුව,Silver line Ribbons ආයතනය වෙත රු.51,900.00ක් ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.5 puc/Ac7/බහුකාර්යය/2018 ලිපිගොනුවට අදාළව ආයතන අංශයෙහි ඇති බහුකාර්යය මුද්‍රණ යන්ත්‍රයහි සේවා ගිවිසුම 2022.08.01 දින සිට 2023.07.31 දින දක්වා අළුත් කිරීම වෙනුවෙන් කොළඹ ,Metropolitan office (pvt) ltd. ආයතනය වෙත රු.20,700.00ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

UVQ 02913		=	18000.00
VAT	15%	=	2700.00
		=	20,700.00

කොළඹ ,Metropolitan office (pvt) ltd. ආයතනය වෙත රු.20,700.00ක් ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.6 puc/Ac7/G-07/2022 ලිපිගොනුවට අදාළව C 25W Grade concrete ද්‍රව්‍ය මිලදී ගැනිම වෙනුවෙන් Tokyo Supermix(pvt)ltd ආයතනය වෙත රු.124,620.00 ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

2022.08.12
Readymix Concrete c25/200 2.5 M3 =124 ,620.00

Tokyo Supermix(pvt)ltd ආයතනය වෙත රු.124,620.00 ක් ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.7 puc/Ac7/G-07/2022 ලිපිගොනුවට අදාළව C 25W Grade concrete ද්‍රව්‍යහදිසි අවශ්‍යතාවය මත අත්පිට මුදලට එම කාර්යය සිදුකරන කොන්ත්‍රාත්කරු මිලදී ගැනිම වෙනුවෙන් ඒ සඳහා වැයවූ මුදල රු.149,466.00 ක් ඔවුන් වෙත සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල ,මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

2022.08.19
Readymix Concrete c25/200 =149,466.00

කොන්ත්‍රාත්කරු වෙත ගෙවන ලද රු 149,466.00 ක මුදල ගෙවීම ,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.8 puc/Ac7/ආයුර්වේද/2021 ලිපිගොනුවට අදාළව ආයුර්වේද මධ්‍යස්ථානයට අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් 2022.07.20 නාවින්න,Sri lanka Aurvedic Drugs Corporation වෙත රු.480,315.00 ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල ,මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

නාවින්න,Sri lanka Aurvedic Drugs Corporation වෙත රු.480,315.00 ක් ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.9 puc/Ac7/ආයුර්වේද/2021 ලිපිගොනුවට අදාළව ආයුර්වේද මධ්‍යස්ථානයට අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් 2022.09.15 නාවින්න,Sri lanka Aurvedic Drugs Corporation වෙත රු.100,000.00 ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල ,මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

නාවින්න,Sri lanka Aurvedic Drugs Corporation වෙත රු.100,000.00 ක් ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.10 puc/Ac7/G-26/2022 ලිපිගොනුවට අදාළව පිහිණුම් තටාකයට අවශ්‍ය රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් Aqua Technologies (pvt) ආයතනය වෙත , රු.609,000.00 ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

Alum Powder 50Kg 50000.00× 01 = 50000.00

DPD NO -01 Rapid test tablets	500.00× 78	=	39000.00
Phenol red tablets	500.00× 140	=	70000.00
70% Chlorine (25 Kg drum)	45000.00× 10	=	450,000.00
		=	609,000.00

Aqua Technologies (pvt) ආයතනය වෙත , රු.609,000.00 ක් ගෙවීම ,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.11 puc/Ac7/G-26/2022 ලිපිගොනුවට අදාළව පිහිණුම් තටාකයට අවශ්‍ය තරාදිය මිලදී ගැනීම වෙනුවෙන් පානදුර, තරාදි පියස වෙත , රු.12,000.00 ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී..

දුනු තරාදිය 30Kg (Electroni) 12000.00× 01 = 12000.00

පානදුර, තරාදි පියස වෙත , රු.12,000.00 ක් ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.12 puc/Ac7/G-26/2022 ලිපිගොනුවට අදාළව පිහිණුම් තටාකයට අවශ්‍ය SODA ASH මිලදී ගැනීම වෙනුවෙන් Aqua Technologies (pvt), ආයතනය වෙත රු.25,000.00 ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල .මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

SODA ASH 25KG 25,000.00× 01 = 25,000.00

Aqua Technologies (pvt), ආයතනය වෙත රු.25,000.00 ක් ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

5.13 puc/Ac7/G-10/2022 ලිපිගොනුවට අදාළව ගබඩාවෙන් කරන ලද ඉල්ලීම අනුව මිලදී ගත් සබන් සහ ඉදල් වෙනුවෙන් B.M.C.P Balasooriya ආයතනය වෙත රු.188,250.00 ක් සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

ලයිෆ්බෝයි සබන්	176.00× 1000	=	176000.00
ඉදල්	245.00× 50	=	12250.00
		=	188,250.00

B.M.C.P Balasooriya ආයතනය වෙත රු.188,250.00 ක් ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

06. <u>කර්මාන්ත අංශය</u>

6.1 PUC/05/03/02-02/2021 ලිපි ගොනුවට අනුව 2022.08.08 සිට 2022.08.31 දක්වා නගර සභා වාහන වෙනුවෙන් නිකුත් කරන ලද පෙට්‍රල් ඉන්ධන සඳහා එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද රු.94,680.50 ක මුදල , මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත රු.94,680.50 ක මුදල ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.2 PUC/05/03/02-01/2022 ලිපි ගොනුවට අනුව 2022.08.13 සිට 2022.08.31 දක්වා නගර සභා වාහන වෙනුවෙන් නිකුත් කරන ලද ඩීසල් ඉන්ධන සඳහා එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද රු.605,440.00 ක මුදල , මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත රු.605,440.00 ක මුදල ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.3 PUC/05/03/02-01/2022 ලිපි ගොනුවට අනුව 2022.07.07 සිට 2022.08.08 දක්වා නගර සභා වාහන වෙනුවෙන් නිකුත් කරන ලද ඩීසල් ඉන්ධන සඳහා Panadura Auto Service & Filing Station ආයතනය වෙත සහා ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද රු.293,435.00ක මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

2022.07.07 - 2022.07.30	- රු 96,790.00
2022.08.03 – 2022.08.08	- රු 196,645.00
	රු 293,435.00

Panadura Auto Service & Filing Station ආයතනය වෙත රු.293,435.00ක මුදල ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.4 PUC/05/03/02-02/2022 ලිපි ගොනුවට අනුව 2022.08.18 සිට 2022.09.08 දක්වා නගර සභා වාහන වෙනුවෙන් නිකුත් කරන ලද පෙට්‍රල් ඉන්ධන සඳහා Panadura Auto Service & Filing Station ආයතනය වෙත සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද රු.36,957.25 ක මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

Panadura Auto Service & Filing Station ආයතනය වෙත රු.36,957.25 ක මුදල ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.5 PUC/05/03/02-02/2022 ලිපි ගොනුවට අනුව 2022.09.02 සිට 2022.09.09 දක්වා නගර සභා වාහන වෙනුවෙන් නිකුත් කරන ලද පෙට්‍රල් ඉන්ධන සඳහා එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද රු.35,425.00 ක මුදල , මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත රු.35,425.00 ක මුදල ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.6 UCP/05/02/02/2022 ලිපි ගොනුවට අනුව පාණදුර නගර සභාවට අයත් ගොඩනැගිලි වල 2022 සැප්තැම්බර් මස 13 වන දින දක්වා ලැබී ඇති ජල බිල්පත් වෙනුවෙන් ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු.93,110.66 ක මුදල,මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත රු.93,110.66 ක මුදල ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.7 UCP/05/02/01/2022 ලිපි ගොනුවට අනුව පාණදුර නගර සභාවට අයත් ගොඩනැගිලි වල(නගර ශාලාව සමඟ) 2022 සැප්තැම්බර් මසදක්වා ලැබී ඇති විදුලි බිල්පත් වෙනුවෙන් සී/ස ලංකා විදුලි (පෞද්) සමාගම වෙත සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු.265,390.62 ක මුදල,මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

සී/ස ලංකා විදුලි (පෞද්) සමාගම වෙත රු.265,390.62 ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.8 PUC/05/02/පොදු/2022 ලිපිගොනුවට අනුව,වෙරළ උද්‍යාන වැසිකිළි පද්ධතිය සම්බන්ධව 2019, 2020 වර්ෂවලදී සභාව විසින් යූ.සේපාලිකා ටෙක්ෂානි මහත්මිය සමඟ බදු ගිවිසුම්ගතව ඇත.එම ගිවිසුම 2020.12.31 දිනෙන් අවසන්ව ඇත.2020.12.31 දක්වා වූ හිඟ විදුලි බිල්පත ගෙවීම් කරන ලෙස ඇය වෙත ලිපි,සිහිකැඳවීම් යවා ඇති නමුත් ඒ සම්බන්ධව මෙතෙක් කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත.එබැවින් 2021.06.28 දිනැති මුදල් කමිටු තීරණය පරිදි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීති අංශය කටයුතු කර ඇත.

මෙයට අදාළව හිඟ විදුලි බිල්පත් මුදල සඳහා විසන්ධි කිරීමේ නිවේදන සී/ස ලංකා විදුලි (පෞද්.) සමාගම විසින් අප වෙත එවා ඇත.මෙම සම්බන්ධතාවය විසන්ධි කළහොත් බිල්පතට අමතරව නව සම්බන්ධතා ගාස්තුද ගෙවීමට සිදුවන බැවින් හා ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් බිල්පතට අමතරව ප්‍රමාද ගාස්තුද එකතු වන බැවින් මෙම නිවේදනයට අනුව අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට යටත්ව සී/ස ලංකා විදුලි (පෞද්.) සමාගම වෙත ගෙවන ලද රු 7372.83 ක මුදල,මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

සී/ස ලංකා විදුලි (පෞද්.) සමාගම වෙත රු 7372.83 ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.9 PUC/05/07/18/2022 ලිපිගොනුවට අනුව,පාණදුර නගර සභාවට අයත් වෙරළ උද්‍යාන වැසිකිළි පද්ධතිය යූ.සේපාලිකා ටෙක්ෂානි යන අයට බදු දීම සම්බන්ධ ගිවිසුමට අදාලව,හිඟ වාරික මුදල් හා ජල විදුලි බිල් නොගෙවීම සම්බන්ධව ඇය වෙත නඩු පැවරීම සඳහා මෙම සභාවේ ලියාපදිංචි නීතිඥ තනුජා ද සිල්වා මෙය විසින් ඉල්ලා සිටින ලද වෘත්තීමය ගාස්තු වන රු 30,000/= ක මුදල ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

නීතිඥ තනුජා ද සිල්වා මෙය වෙත රු 30,000.00 ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.10 PUC/05/07/15/2022 ලිපිගොනුවට අනුව,බස්නාහිර පළාත් බද කළුතර සිවිල් අභියාචනා මහාධිකරණ නඩු අංක 02/19 F නඩුව සඳහා 2022.07.20 දින ලිඛිත දේශන ගොනු කිරීම සඳහාත් 2022.08.30 දින පෙනී සිටීම සඳහාත් නීතිඥ අජිත් සපරමාදු මහතා විසින් පහත සඳහන් පරිදි ගාස්තු ඉල්ලා සිටී.එම මුදල ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

2022.07.20 දින ලිඛිත දේශන ඉදිරිපත් කිරීම	- රු 20,000.00
2022.08.30 දින පෙනී සිටීම සඳහා	- රු 20,000.00
	- රු 40,000.00

(එස්.ආනන්ද ජයරත්න හා තමරා පුෂ්පමංජරී ජයරත්න යන අය විසින් , ප්‍රශ්නගත ඉඩම හරහා පාණදුර නගර සභාව විසින් කාණුවක් කැපීම සම්බන්ධව ව්‍යවස්ථාපිත බලයක් නොමැති බව ප්‍රකාශ කරවා ගැනීම සඳහා පාණදුර දිසා

අධිකාරණයේ පවරන ලද 2386/ L නඩුවේ පැමිණිල්ල නිශ්ප්‍රභා කරමින් දෙන ලද තීන්දුවට එරෙහිව කළුතර සිවිල් අභියාචනා මහාධිකරණය වෙත කරන ලද අභියාචනය සම්බන්ධ නඩුව)

නීතිඥ අජිත් සපරමාදු මහතා වෙත රු 40,000.00 ක මුදල ගෙවීම , මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

<u>2022.09.15 වන දින කර්මාන්ත කමිටුවෙන් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරනු ලබන කරුණු</u>

6.11 PUC/05/03/01-07/2020 ලිපි ගොනුවට අනුව 226-1085 අංක දරණ ගලි රථය ,Panadura Auto Service ආයතනය මඟින් සේවා කිරීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 39,435/= ක මුදල ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

Panadura Auto Service ආයතනය වෙත රු 39,435.00 ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.12 PUC/05/03/01-23/2020 ලිපි ගොනුවට අනුව ZB-0323 අංක දරණ කම්පැක්ටර් රථය,Panadura Auto Service ආයතනය මඟින් සේවා කිරීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 32,115/= ක මුදල ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

Panadura Auto Service ආයතනය වෙත රු 32,115.00 ක මුදල ගෙවීම, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.13 PUC/5/4/1/21/2022 කසල අංගනය යාබද රථ ගාලෙහි වැසිකිළිය අළුත්වැඩියා කිරීම ගොනුවට අනුව සකස් කර ඇති රු 149,192.09 ක් වූ ඇස්තමේන්තුව, කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 149,192.09 ක් වූ ඇස්තමේන්තුව,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

07. <u>සාකච්ඡා කරන ලද වෙනත් කරුණු</u>

7.1 <u>මිශ්‍ර ආදායම් අංශය</u>

7.1.1 පාණදුර පොදු වෙළඳපළ පැරණි වෙළඳ සංකීර්ණය තුළ කඩා ඉවත් කිරීමට ලක්වූ කඩවලට අයත් පහත සඳහන් කඩ සඳහා පහත දක්වා ඇති පරිදි කඩකුලී හිඟ පවතී.

CV 87 - රු 13,293.34
CV 88 - රු 13,293.34

එම කඩ සඳහා කුලී අය කිරීමට ආදායම් පරීක්ෂකවරුන් නො.128,පාසල පාර,කුරුප්පුමුල්ල,පාණදුර යන ලිපිනය සොයා ගොස් දැනුම් දුන් අතර,එම කඩ දෙක බදු ගෙන තිබූ හඳුන්ගේ ගුණසේන මයා 2018.12.22 දින මියගොස් ඇති බව වාර්තා විය.

ඔහුගේ භාර්යාව වන එල්.පුෂ්පකාන්ති යන අය විසින් පවුලේ ආර්ථික අපහසුකම් ඇති බැවින් තමාට සහ දියණියට එම හිඟ කඩ කුලී ගෙවීමට අපහසු බව දන්වා,ග්‍රාම නිළධාරීද සහතික කළ ලිපියක්,මරණ සහතිකයක්ද සහිතව අප වෙත ඉදිරිපත් කර ඇත.

ඇයගේ ඉල්ලීම පරිදි,එම හිඟ කඩ කුලී අය නොකර සිටීම පිළිබඳව තීරණයක් සඳහා මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

ආදායම් පරීක්ෂකගේ නිර්දේශ හා අඩු ආදායම්ලාභී බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නිර්දේශ ලබාගනිමින් කපා හැරීම සඳහා මහා සභාව වෙත යෝජනා ඉදිරිපත් කිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.2 මුදල් කමිටුව වෙත ඉදිරිපත් කර වරිපනම් සංශෝධන සිදුකරන්නාහී දේපළ වල පවතින හිඟ වරිපනම් බදු මුදල් අයකිරීම පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් පසුගිය මහා සභා වාරයේදී ඉල්ලා සිටි බැවින් එම වාර්තාව මීළඟ සභා වාරයට ලබාදෙන ලෙස මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.3 ආදායම් එකතු කරන්නාවූ සභාව සතු ස්ථානයන්හී 2022 ජනවාරි සිට 2022 සැප්තැම්බර් දක්වා වූ ආදායම් පිළිබඳ වාර්තාවක් මීළඟ මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.09.26 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු නිර්දේශ අනුමත කිරීමට තීරණය විය.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 2209/38 හා 2021.01.06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද පාණුදුර නගර සභා රැස්වීම් කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 19.8 වගන්තිය අනුව ඉදිරිපත් කරන ලද යෝජනා.

(ඊ.2) ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා ඉදිරිපත් කරන ලද යෝජනා

(ඊ.2.1) නල්ලූරුව,මෝදරවිල පාරේ කැටඋඩදෙනිය වත්ත අසල දකුණු පැත්තේ දෙවන පාලම අනාරක්ෂිත තත්ත්වයේ පවතින බැවින් දෙපස අඩි දෙකක් පමණ පුළුල් කර සිමෙන්ති වැටි වලින් දෙපස සාදා දෙන මෙන් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර නල්ලූරුව,මෝදරවිල පාරේ, කැටඋඩදෙනිය වත්ත අසල දකුණු පැත්තේ දෙවන පාලම අනාරක්ෂිත තත්ත්වයේ පවතින බැවින් දෙපස අඩි දෙකක් පමණ පුළුල් කර සිමෙන්ති වැටි වලින් දෙපස සකස් කිරීමට තීරණය විය.

(ඊ.2.2) සංඝානන්ද හරස් පාරේ කාණුව ලෙවල් නොමැති බැවින් වතුර බැස නොයාම හේතුවෙන් අඟල් දෙකක පමණ කොන්ක්‍රීට් තට්ටුවක් දමා ලෙවල් කර දෙන මෙන් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර සංඝානන්ද හරස් පාරේ කාණුව ලෙවල් නොමැති බැවින් වතුර බැස නොයන බැවින් එම කාණුව, අඟල් දෙකක පමණ කොන්ක්‍රීට් තට්ටුවක් දමා ලෙවල් කිරීමට තීරණය විය.

(ඊ.2.3)නෙවිල් පෙරේරා හරස් මාර්ගය ඉතා අබලන්වී ඇති බැවින් කුට්ටිගල් අල්ලා අබලන්වී ඇති පෙදෙසේ හැකි ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර, නෙවිල් පෙරේරා හරස් මාර්ගයේ අබලන් වී ඇති ස්ථාන කුට්ටිගල් අල්ලා ප්‍රතිසංස්කරණය කිරීමට තීරණය විය.

(ඊ.2.4) නෙවිල් පෙරේරා මාවතේ ඇති වසර සීයක් පමණ පැරණි ලුනුවරන ගස ආරක්ෂිත බැම්මක් බැඳ සංරක්ෂණය කර දෙන මෙන් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර නෙවිල් පෙරේරා මාවතේ ඇති වසර සීයක් පමණ පැරණි ලුනුවරන ගස ආරක්ෂිත බැම්මක් බැඳ සංරක්ෂණය කිරීමට තීරණය විය.

(ඊ.2.5) මෝදරවිල,කැටඋඩදෙනිය වත්තේ මීටර් 25 ක පමණ අබලන්වී ඇති බැවින් එම කොටස ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර මෝදරවිල,කැටඋඩදෙනිය වත්තේ මීටර් 25 ක පමණ අබලන්වී ඇති කොටස ප්‍රතිසංස්කරණය කිරීමට තීරණය විය.

(උ) කාරක සභා වාර්තා පිළිබඳ සමාලෝචනය කිරීම -

(උ.1) 2022.09.12 මහජන පෙත්සම් කාරක සභා වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු සභාපතිතුමා</u>

සිරිල් ජෑන්ස් පාරේ වංගුවේ ඉදිකළ අනවසර ඉදිකිරීම සම්බන්ධ කාරණාව පෙත්සම් කාරක සභාවේදී සලකා බැලූ අතර එම කරුණ සම්බන්ධයෙන් නැවත ගරු ආණ්ඩුකාරතුමා වෙත පැමිණිල්ලක් යොමු කර තිබෙනවා.එහි සඳහන් කර තිබෙනවා මෙම කරුණ සම්බන්ධයෙන් තීරණ ගන්නේ සභාපතිගෙ දේශපාලන උවමනාවන් මත කියා.මෙසේ පවසා තිබෙන්නේ මුලින් මෙම ගොඩනැගිල්ල කඩා ඉවත් කරන්න කියා පසුව එය ඉදිකිරීමට අවසර ලබාදීම කියන කාරණය මතයි.මේ කරුණ සම්බන්ධයෙන් කිසිදු තීරණයක් දේශපාලන උවමනාව මත සිදුවුණේ නැහැ.මෙවන් කාරණා පිළිබඳ ඉතා පරිස්සමින් කටයුතු කළ යුතු අතර මේ සම්බන්ධයෙන් ලිපි සකස් කිරීමේ කටයුතු සඳහා පෙත්සම් කාරක සභාවේ සාමාජිකයින් අදාළ තොරතුරු නිළධාරීන් වෙත ලබාදෙමින් සහය ලබාදෙන ලෙස පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

ගරු ආණ්ඩුකාරතුමාට යොමුකරන ලද ලිපියට අනුව මෙම පැමිණිලි පාර්ශවය හා විත්ති පාර්ශවය නැවතත් පෙත්සම්කාරක සභාව වෙත කැඳවන ලදී.එහිදී පැමිණිලිකාර පාර්ශවයෙන් ," සභාපතිගෙ දේශපාලන උවමනාවන් මත සිදුකරන ලදී" යනුවෙන් පැවසීමට සාක්ෂි තිබේද යන්න විමසා සිටි අතර ඒ සඳහා ඇයට සාක්ෂි ඉදිරිපත් කිරීමට නොහැකි වුණා.විත්තිකාර පාර්ශවයෙන්ද විමසා සිටියා මෙම කාරණයේදී සභාපතිතුමාගේ දේශපාලනය මත සහයක් ලැබුණාද කියා,එහිදි ඇය ලිපියක් ඉදිරිපත් කර

සිටි අතර එහි සඳහන්ව තිබුණෙ නගර සභාවේ වරිපනම් ගෙවන සාමාජිකයෙකු හැටියට ඔබට අයිතියක් තිබෙනවා වරිපනම් ගෙවාගෙන යාමට කියා පමණයි යැයි පවසා සිටින ලදී.

(උ.2) 2022.09.15 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(උ.3) 2022.09.15 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(උ.4) 2022.09.26 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඌ) සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය කිරීම -

(ඌ.1) 2022 අගෝස්තු මස ලැබීම් ගෙවීම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඌ.2) 2022 අගෝස්තු මස වරිපනම් අයකිරීම සම්බන්ධ මාසික ප්‍රගති වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

වරිපනම් පිළිබඳ වාර්තාව පරීක්ෂා කිරීමේදී වරිපනම් හිඟ සැලකිය යුතු ප්‍රමාණයක් පවතිනවා. එමෙන්ම පෙර ඉල්ලා සිටි පරිදි මුදල් කමිටුව වෙත ඉදිරිපත් කළ කරුණු වල පැවති හිඟ වරිපනම් අයකර තිබේද යන්න වාර්තාව අද දින ලබාදී තිබෙන අතර එම වාර්තාව සලකා බැලීමේදීත් පෙනී යන්නේ අයකළ යුතු හිඟ වරිපනම් සැලකිය යුතු ප්‍රමාණයක් අයකර ගෙන නොමැති බවයි. මෙම වර්ෂය අවසන් වීමට තවත් ඇත්තේ මාස 02 ක පමණ කාලයක්.මෙම හිඟ වරිපනම් කවදාද එකතු කරන්නෙ.එමනිසා මේ සඳහා නිසි වැඩපිළිවෙළක් යොදන ලෙස පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

හිඟ වරිපනම් එකතු කිරීම විධිමත් කළ යුතු අතර ඒ අනුව දිනපතා ආදායම් පරීක්ෂක මහතුන් නිවෙස් වෙත වරිපනම් එකතු කිරීමට යා යුතුයි.එමෙන්ම දෛනිකව යන නිවාස අංකද එම නිවාස වලින් ලබාගත් දුරකථන අංකද එකතු කළ මුදලද සඳහන් කරමින් දෛනිකව වාර්තාවක් ලබාදිය යුතුයි.එමනිසා මේ තොරතුරු ඇතුළත් කිරීමට ආකෘතියක් කඩිනමින් සකස් කර ආදායම් පරීක්ෂක මහතුන් වෙත ලබාදී එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඌ.3) 2022.08.31 දිනට හිඟ ආදායම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ) අංශ ප්‍රගතිය සලකා බැලීම -

(එ.1) 2022 අගෝස්තු මස ආදාහනාගාරයේ ආදායම් වියදම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.2) 2022.08.01 සිට 2022.08.31 දක්වා සභාව විසින් කසළ කළමනාකරණයේදී ,කසළ අවසන් බැහැර කිරීම පිළිබඳ වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.3) 2022 සැප්තැම්බර් මාසයේ ඩෙංගු මර්දන ව්‍යාපෘති සේවකයින්, සේවයේ යෙද වූ ආකාරය පිළිබඳ වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.4) බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමියගේ උපදෙස් පරිදි 2020.02.10 වන දින බඳවා ගන්නා ලද ඩෙංගු මර්දන ව්‍යාපෘති සේවකයින් 2022 සැප්තැම්බර් මාසයේ සේවයේ යෙද වූ ආකාරය පිළිබඳ වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.5) 2022 අගෝස්තු මස නගර සභා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රගතිය

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.6) 2022 අගෝස්තු මස පෙර පාසල් මාසික ප්‍රගතිය

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඒ) වෙනත් කරුණු

(ඒ.1) <u>ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා</u>

(ඒ.1.1) පාණදුර,සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය අසළ අලුතින් පීසාහට් ආයතනයක් විවෘතකර තිබෙනවා.මෙම ආයතනයට එන වාහන මේවන විට වීරසිංහ පටුමඟේ නවතා තැබීමට යොමු වෙලා තිබෙනවා.එය එම පටුමඟේ ජනතාවට මහත් අසීරුතාවයකට මුහුණ දෙන බැවින් මේ සම්බන්ධව යම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මෙම ආයතනය ඉදිරියේ වාහන නැවතීමට ඉඩ තිබෙනවා.එසේ තිබියදී වීරසිංහ පටුමඟේ වාහන නැවතීම සුදුසු නැහැ.එමනිසා එම මාර්ගයේ වාහන නැවතීම තහනම් යනුවෙන් පුවරුවක් සවිකිරීම සුදුසු බව පවසා සිටින ලදී.

(ඒ.1.2) විලී ඩයස් මාවතේ නිවසක තාප්පය බැඳ ඇති අතර නිවසේ සිට කණු දෙකක් තාප්පයට පැමිණ නිවස හා සම්බන්ධ වී තිබෙනවා.මෙසේ කණු දැම්මේ කෙසේද යන්නත් තාප්පය සඳහා සැලැස්මක් අනුමත කළාද යන්නත් ගැටළුවක්ව පවතිනවා.මෙම මාර්ගය පටු මාර්ගයක්.මෙහි නිවාස මෙසේ තාප්ප ඉදිකිරීමට යොමු වුවහොත් ඉදිරියේදී මෙම මාර්ගය පුළුල් කිරීමට නොහැකි වෙනවා.මේවා අනවසර ඉදිකිරීම් විදිහටයි මා දකින්නේ.එමනිසා මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.2) <u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

(ඒ.2.1) මීට පෙර පාරේ තබාගෙන ඌරුමස් වෙළඳාමේ යෙදුණු දෙදෙනෙකු නගර සභාව මැදිහත් වී ඉවත් කළ අතර මේවන විට එම ස්ථානය ආසන්නයේම ඌරුමස් කඩ දාගෙන විකුණනවා.ඌරුමස් අලෙවි කළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් තිබෙන අතරම ඒ සඳහා සභාවෙන් අවසර ගැනීමක්ද සිදුකල යුතුයි.එමනිසා මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ පිළිබඳව සොයා බලා නිසි පියවර ගන්නා ලෙස යැයි පවසා සිටින ලදී.

(ඒ.3) <u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

(ඒ.3.1) ගරු නාගරික මන්ත්‍රී බන්දුල සොයිසා මහතා විසින් බේබි ශෙරමි ආයතනයත්,පාණදුර සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයත් සමඟ සම්බන්ධවී ගැබිණි මව්වරුන්ට වැඩ සටහනක් පසුගිය දිනක සංවිධානය කර තිබූ අතර එහිදී ජගත් වටවල හා ස්වර්ණා වටවල මහත්මිය විසින් දරු නැළවිලි හා ළමා ගීත ගායනයන්ද සිදුකළා.මෙය ඉතා වටින වැඩසටහනක් වන අතර එවන් වැඩසටහනක් සංවිධානය කිරීම සම්බන්ධයෙන් ගරු නාගරික මන්ත්‍රී බන්දුල සොයිසා මහතාට ස්තූතිය පුදකරන බව පවසා සිටින ලදී.එමෙන්ම මෙවන් වැඩසටහන් සිදුකිරීමට නගර සභාවද යොමු විය යුතු බව පවසා සිටින ලදී.

(ඒ.3.2) මහා සභා වාර ගණනාවකදී අදහස් ප්‍රකාශ කළ පාණදුර පුස්තකාලයේ වැසිකිළි පද්ධතිය මේවන විට අළුත්වැඩියා කරමින් පවතිනවා.එමනිසා ඒ පිළිබඳව කර්මාන්ත අංශයට ස්තූතිය පුදකරන බව පවසා සිටින ලදී.

(ඒ.3.3)මීට පෙර සභා වාරයකදී හඩිසන් උද්‍යානයේ ළමුන් සෙල්ලම් කරන භාණ්ඩ අළුත්වැඩියා කළ යුතු බව පවසා සිටි අතර එයද මේවන විට අළුත්වැඩියා කර තිබෙනවා.ඒ සඳහාද ස්තූතිය පුදකරන බව පවසා සිටින ලදී.හඩිසන් උද්‍යානයට මම දිනක් සවස 05 ට විතර පැමිණි අතර ඒ අවස්ථාවේ හඩිසන් උද්‍යානය බලා ගැනීමට කිසිදු සභා සේවකයෙකු සිටියේ නැහැ.එමෙන්ම හඩිසන් උද්‍යානයෙන් පිහිණුම්තටාකය වෙත ඇතුළු වීමට ඇති ගේට්ටුවෙන් මා ඇතුළු වී පිහිණුම් තටාකයේ සේවකයන්ගෙන් විමසා සිටියදී ඔවුන් පවසා සිටියා යතුර ඔවුන්ට භාරදී අදාල සේවක මහතා වරුවෙන් ගියබව.එවිට මා විමසා සිටියා ගේට්ටුව වසන්නෙ කවුද කියා.ඔවුන් පවසා සිටියා සභාවෙන් කවුරුන් හෝ එවනවා නැත්නම් ඔවුන්ම වසා ගෙන යනවා කියා.රාත්‍රී 7.30 වෙනතුරු එම ස්ථානයේ රැඳී සිටියද ගේට්ටුව වැසීමට කවුරුත් පැමිණියේ නැහැ.තවද පිහිණුම් තටාකයේ ආපනශාලාව පැවති ස්ථානය ආසන්නයේ ශාරීරික ව්‍යායාම කරන උපකරණ වගයක් දමා ඇති අතර ගඟ දෙසින් කවුරුන් හෝ පැමිණ මේවා රැගෙන ගියහොත් එය සභාවට පාඩුවක්.එමනිසා මේ කරුණු සියල්ලම සලකා බලමින් හඩිසන් උද්‍යානයේ සිට පිහිණුම් තටාකය වෙත යන ගේට්ටුව වසා දැමීමට කටයුතු කරන ලෙසත් හඩිසන් උද්‍යානය හා පිහිණුම් තටාකය යන ස්ථාන දෙකම බලා ගත හැකි වන ලෙස රාත්‍රී මුරකරුවෙකු යොදවන ලෙසත් ඉල්ලා සිටින බව පවසා සිටින ලදී.

(ඒ.3.4) වැකඩ ජනජය නිවාසලාභීන්ට ඔප්පු ලබාදීම සම්බන්ධ කටයුත්ත සඳහා ගරු සභාපතිතුමාගේ මැදිහත්වීම සිදුකරන ලෙස නැවතත් ඉල්ලා සිටින බව පවසා සිටින ලදී.

(ඒ.3.5) වැකඩ කියවීම් ශාලාවේ ඉහළ මහලේ සිවිලිම ගැසීමේ කටයුතු අදාළ කොන්ත්‍රාත්කරු විසින් භාණ්ඩ වල මිල ඉහළ ගොස් ඇති බැවින් ඉටු කළ නොහැකි බව පවසා සිටිනවා.එබැවින් සිවිලිම නැතුව හෝ විදුලිය ලබාදී ලයිට් සවිකර මෙය ආරම්භ කිරීමට අදාළ කටයුතු ඉටු කරන ලෙසත් වැකඩ පුස්තකාලය,වැකඩ පෙර පාසල,වැකඩ මාතෘ සායනය යනාදී ස්ථාන කිහිපයක් එම ස්ථානයේ පිහිටා තිබෙන බැවින් ඒවායේ ආරක්ෂාව සඳහා එම ස්ථානයට මුරකරුවෙකු යොදවන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.3.6) වැකඩ ක්‍රීඩා පිටියේ තිබෙන කොන්ක්‍රීට්ගල් ඉවත් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

ගරු සභාපතිතුමා

හඩිසන් උද්‍යානයේ ගඟ අසල තිබෙන පඩිපෙළවල් ලඟට කසල ඇවිත් රැදෙන බැවින් එම පඩිපෙළ ළඟ සිට අඩි 15 ක් විතර ගඟ දෙසින් ගල් වැටියක් දැම්මොත් එම කසල පැමිණීම නතර කළ හැකියි.එමනිසා එම වැටිය දැමීමේදී භාවිතයට ගැනීමට වැකඩ ක්‍රීඩා පිටියේ ඇති කොන්ක්‍රීට් ගල් ටික රැගෙන ආ හැකි බව පවසා සිටින ලදී.

(ඒ.3.7) වැකඩ,සුමනධීර මාවතේ ඉඩම මේවන විට කම්බි ගසා ඇති අතර එම ඉඩමේ කෙසෙල් පැළ සිටුවා ඵලදාවක් ලබා ගැනීමට බලාපොරොත්තුවක් තිබේනම් එම ස්ථානයටද මුරකරුවෙකු යොදවන ලෙස පවසා සිටින ලදී.

(ඒ.3.8) මිනුවන්පිටිය සුසාන භූමියේ තිබෙන ගොඩනැගිල්ල යම් කිසි කාර්යයක් සඳහා යොදාගත හැකි වන ලෙස සකස් කිරීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.3.9) පසුගිය මහා සභාවාරයකදීත් පවසා සිටියා භාණ්ඩ මිලදී ගැනීමේදී කුඩා ප්‍රමාණයන්ගෙන් මිලදී නොගෙන වසරටම ඇති වන ලෙස මිලදී ගෙන ගබඩා කරගන්නා ලෙස.නමුදු ගියමස මුදල් කමිටු වාර්තාවේද එසේ ඇණ 250 ක් ඉබ්බෙක් ගැනීමට වැනි කුඩා ප්‍රමාණයන්ගෙන් භාණ්ඩ මිලදී ගැනීම් දක්නට ලැබෙනවා.එමනිසා මෙය නිසි ලෙස සකස් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.3.10) පසුගිය ඉරිදා නගර ශාලාව වෙත ගිය අතර එදින සවස 02 ට එහි පෙර පාසලක වැඩසටහනක්ද පැවැත්වීමට නියමිතව තිබුණා.නමුදු ඒ අවස්ථාවේ එම ස්ථානයේ සිටියේ ශාලාභාරකරු පමණයි.එම ස්ථානයට තවත් සේවක මහතෙකු යොදවා තිබෙන නමුදු ඔහු එම ස්ථානයට පැමිණියේ ප්‍රමාද වෙලා.ඒ වගේම සවස ඔහු කලින් පිටවෙලා තිබුණා.මෙසේ සේවකයින්ට ඔවුන්ට උවමනා වේලාවන්ට රාජකාරියට පැමිණීමට හෝ පිටවීමට පුළුවන්ද?එමෙන්ම ඔහු පවසා සිටිනාව ඔහු සභාපතිතුමාගේ මිනිහෙක් ඔහුට උවමනා විදිහට තමයි එතැන වැඩ කටයුතු සිදුවන්නේ කියා.දෙසැම්බර් මාසයේ නගර ශාලාව වෙත යම් ආදායමක් ලැබෙන මාසයක්,එමනිසා එවන් ස්ථාන වලට වැඩ බලන සභාපතිවරු නොයදා වැඩ කළ හැකි සේවකයින් යොදවන ලෙස පවසා සිටින ලදී.සභාපතිතුමාට මෙවන් අය උදවු කළද ඒවා අනිසි ලෙස භාවිතා කිරීමට ඔවුන්ට ඉඩ දෙන්න එපා.එමෙන්ම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා ඉතිරි මාස 06 හෝ සභාව සතු පුස්තකාල, පෙර පාසල්, පිහිණුම් තටාකය වැනි ස්ථාන වෙත ගොස් පරීක්ෂා කිරීමට යොමුවන ලෙස ඉල්ලා සිටින ලදී.

ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා

මෙම ස්ථානයේ සිටින සේවක මහතා,නගර ශාලාවේ පවතින භාණ්ඩ ගබඩාවට භාරදීමකින් තොරව ඔහු භාරයේ තබාගෙන සිටිනවා.එමෙන්ම එම භාණ්ඩ ඔහුගේ පෞද්ගලික වැඩ සඳහාද යොදා ගන්නවා.මේ ආසන්න දිනයකදී ඔහු රාජකාරියේ යෙදී සිටින වේලාවෙම පාසලක වැඩසටහනක් වෙත යොමු වෙළා එහි පින්තූර,මුහුණ පොතේද යොදා තිබෙනවා.ඔහුව රැගෙන ගොස් තිබෙන්නෙත් ප්‍රසිද්ධ මාධ්‍යවේදී මහතෙක් යැයි පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා

ශාලා භාරකරු ලෙස සිටින මහතා තමයි දොරවල් විවෘත කර අනෙකුත් කටයුතු සියල්ල කළේ.අනෙක් සේවකයා ඒ කිසිදු දේකට උදවු නොවී කාමරයට වෙලා නිදාගෙන සිටියා යැයි පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව පළමු වතාවටයි දැනගැනීමට ලැබුණේ එමනිසා ඒ සම්බන්ධයෙන් පියවරක් ගන්නම්.එමෙන්ම නගර ශාලාවේ වෙන්කිරීම් සිදුකර තිබෙන කාලසටහන කර්මාන්ත අංශයට ලබා දී එම දිනවලදී සේවකයෙකු ලබාගෙන එම ස්ථානයට යෙදවීමට මිශ්‍ර ආදායම් අංශය කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

(ඒ.3.11) අ.පො.ස. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ දරුවන් වෙත ශිෂ්‍යත්ව ලබාදීමේ කටයුත්තද කඩිනමින් ඉටු කිරීමට කටයුතු කරමු යැයි පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමා

මෙහිදී සභිකයින් සියල්ලන්ම නම් දෙක බැගින් ලබාදී නැහැ.කෙසේ හෝ මෙම වැඩසටහන කඩිනමින් ඉටු කළ යුතු බැවින් දැනට ලැබී ඇති නම් සඳහා ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහන 2022.10.18 වන දින ඉටු කර අනෙක් කණ්ඩායමට වෙනත් දිනක ලබාදීමට කටයුතු කරමු යැයි පවසා සිටින ලදී.

(ඒ.4) ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය

(ඒ.4.1) ඔක්තොම්බර් 01 වැනි දින ළමා දිනය හා වැඩිහිටි දිනය නිමිත්තෙන් පාණදුර නගර සභා පුස්තකාල හා පාණදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්වී වැඩසටහනක් සංවිධානය කර තිබූ අතර මේ සඳහා සභාවේ සභිකයින් සියළු දෙනාටම ආරාධනා කළද එදින උදෑසන වැඩසටහනට සහභාගී වූයේ මා පමණක් වන අතර ඒ පිළිබඳව කණගාටුවන බව පවසා සිටින ලදී.

(ඒ.5) ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා

(ඒ.5.1) JCB රථය දින ගණනාවක් තිස්සේ නගර සභා ප්‍රධාන කාර්යාල භූමියේ ගලවා දමා තිබෙනවා.එය අළුත්වැඩියාව සඳහා යොමු නොකරන්නේ මන්ද යන්නත් සභාවේ වැඩ කරගන්න සභාව සතු JCB රථ දෙකම අවශ්‍ය බැවින් මෙය කඩිනමින් අළුත්වැඩියා කරන මෙන් පවසා සිටින ලදී.එමෙන්ම බොලෙරෝ රථයද අළුත්වැඩියාව සඳහා ගලවා ඇති බැවින් එහි කටයුතුද අවසන් කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.5.2) සභාවේ ස්ථාන කිහිපයක් පරීක්ෂා කිරීමට ගිය අතර එහිදී හඩිසන් උද්‍යානයේ ඇති වැසිකිළි තුළ ඉහළ මකුළු දැල් බැඳ තිබුණු අතර ඒවා පිරිසිදුකර නැහැ.පිහිණුම් තටාකය නිරීක්ෂණය ගිය අතර එහි සේවකයින් වට මේස සාකච්ඡා පවත්වමින් සිටි අතර කිසිදු වැඩක් කරන බවක් පෙනුනෙ නැහැ.සේවකයින් බලාගැනීමට සිටින පරිපාලක මහතුන්ද නැහැ,සේවකයින් ඔවුන් ගන්නා වැටුපට වැඩක් කරන්නෙත් නැහැ.එම නිසා මේවා සඳහා යම් පියවරක් ගන්නා ලෙස පවසා සිටින ලදී.

(ඒ.6) ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා

(ඒ.6.1)සභාවේ සේවකයින් වෙත පසුගිය වර්ෂයන්වල පෝෂණ මලු ලබාදීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර මේවන විට රටේ පවතින තත්ත්වයද සලකා බලමින් නැවතත් එවන් වැඩසටහනක් සේවකයින් වෙනුවෙන් සංවිධානය කිරීම සුදුසු බවත් එමඟින් සේවකයින්ට යම් දිරිගැන්වීමක් ලබාදිය හැකි බවත් පවසා සිටින ලදී.

(ඒ.6.2) නගර ශාලාව වැනි ශාලාවක් කෙසෙල්වත්තේ පාසලක පවතින අතර එහි මිල ගණන් ඉහළ බැවින් දැන් ජනතාව වැඩි වශයෙන් සභාවේ නගර ශාලාව භාවිතා කිරීමට යොමු වීමක් සිදුවෙනවා.එමනිසා මෙහි අළුත්වැඩියා කළ යුතු ජනෙල් දොරවල් ආදිය අළුත්වැඩියා කිරීම සුදුසු අතර සවස් වන විට නගර ශාලා භූමිය අඳුරු බැවින් එහි මුරකුටිය ආසන්නයේ හෝ ලයිට් එකක් දමා එම එළිමහන් භූමිය ආලෝකවත් කර තැබීම සුදුසු බව පවසා සිටින ලදී.

(ඒ.7) <u>ගරු නාගරික මන්ත්‍රී එච්.වන්දිම ඒ.පීරිස් මහතා</u>

(ඒ.7.1) මිනුවම්පිටිය සුසාන භූමියේ ගේට්ටුව මේවන විට විවෘත කරන්නට සිදුවී තිබෙන්නේ ඔසවා පැත්තකට තැබීමෙන්.එමනිසා මෙය කඩිනමින් සකස් කිරීමට කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.එමෙන්ම යම් කරුණු පිළිබඳව සලකා බැලූ විට පහළින් පවසා සිටින්නේ ඔවුන් යම් ඉල්ලීම් ඉහළට යොමුකර තිබෙනවා නමුත් වැඩේ සිදුවන්නෙ නැහැ කියා.එමනිසා මේ යාන්ත්‍රණයේ තිබෙන ගැටළුව විසඳිය යුතු බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මටත් පහළ සේවකයින් බොහෝ අවස්ථාවල පවසා තිබෙනවා ඉල්ලීම් කර තිබෙන්නේ නමුත් ඉටු වුණේ නැහැ කියා.එමෙන්ම මටත් ගැටළුවක් තිබෙනවා කමිටුවලට යොමු කරන ලෙස අංශ වෙත යොමු කරන ලිපි සියල්ලම කමිටු වෙත යොමු නොවන බව.එමනිසා මේ පිළිබඳව අංශ ප්‍රධානීන් සැලකිලිමත් වන ලෙස පවසා සිටින ලදී.

2022.10.11 වන දින මහා සභා න්‍යාය පත්‍රයට අනුව නියමිත කරුණු එපමණක් වූයෙන් අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය දුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලයට තම ස්තූතිය පුද කරමින් 2022 ඔක්තෝබර් මස 11 වන දින මහා සභාවේ වැඩ කටයුතු ප.ව. 02.45 නිමාවට පත් විය.

සභාපති,

නගර සභාව, ඇම්.ඩී. නන්දන ගුණතිලක
සභාපති
පානදුර නගර සභාව
පාණදුර.

ලේකම්

ටී. මානෙල් සියඹලාගොඩ
ලේකම්
පානදුර නගර සභාව

නගර සභාව,

පාණදුර

2022.10.27